අධ්‍යාපන අමාත්‍යාංශය
නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් අංශය
கல்வி அமைச்சு
திறன்கள் அபிவிருத்தி, தொழில்கல்வி, ஆராய்ச்சி மற்றும் புத்தாக்க பிரிவு
Ministry of Education
Skills Development, Vocational Education, Research and Innovation Division
ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය
தேசிய பயிலுநர் மற்றும் கைத்தொழில் பயிற்சி அதிகாரசபை
National Apprentice & Industrial Training Authority

2022

වාර්ෂික වාර්තාව
வருடாந்த அறிக்கை
ANNUAL REPORT

971. ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය.
971, ஸ்ரீ ஜயவர்த்தனபுர மாவத்தை,வெலிக்கடை, இராஜகிரிய.
971, Sri Jayawardanapura Mawatha, Welikada, Rajagiriya

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය

වාර්ෂික වාර්තාව

2022

පටුන...

සභාපතිතුමාගේ පණිවිඩය	01
දැක්ම හා මෙහෙවර	02
අධිකාරියේ අරමුණු	03
අධිකාරියේ ප්‍රධාන කාර්යයන්	03
හැඳින්වීම	04
පාලක මණ්ඩලය	05
අධ්‍යක්ෂ මණ්ඩල නිලධාරීන්	07
දිස්ත්‍රික් කළමනාකරුවන්	08
පරිපාලන ව්‍යුහය	09
දත්ත නිරූපණය සහ විශ්ලේෂණය	10
විශේෂ වැඩසටහන් හා තොරතුරු	25
2023 වර්ෂය සඳහා වැඩසටහන් හා ඉලක්ක	28
අවසන් ගිණුම් වාර්තා	30
විගණකාධිපති වාර්තාව	38

සභාපතිතුමාගේ පණිවුඩය.....



අඩසිය වසක් පසු කරමින් 51 වසරක සාඩම්බර ගමන් මඟකට උරුමකම් පෑමට සමත් ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය 1990 අංක 20 දරන තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනත යටතේ පුහුණු කිරීම් කටයුතු වඩාත් පුළුල් ලෙස ආරම්භ කිරීම සිදුවිය.

දැයේ දූ පුතුන් වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ නිපුණ ශිල්පීන් බවට පත්කරලීම මෙන්ම NVQ - RPL ක්‍රමවේදය ඔස්සේ ලාංකික වෘත්තීය නිපුණ ශිල්පීන් රැසකට විදෙස් රැකියා වරම් ලබාදීමේ කාර්ය භාරය සඳහා මෙම වසර තුළ අප ආයතනය ප්‍රමුඛත්වය ලබාදෙන ලදී. වෘත්තීය නිපුණත්වය පමණක් නොව අප විසින් විදේශ රැකියා වෙළඳපොළට ගැලපෙන භාෂා නිපුණත්වය ලබාදීමේ කර්තව්‍යය ද මෙම වසර තුළ ආරම්භ කරමින් ජපන් හා කොරියානු භාෂා දැනුම ලබාදීම මේ වසර තුළ දී ආරම්භ කරන ලදී.

2022 වර්ෂය තුළ අප ආයතනය සංචාරක ක්ෂේත්‍රයේ රැකියා ප්‍රවර්ධනය කරලීමේ අරමුණින් ලක් රජය සහ ඕස්ට්‍රේලියානු රජය එක්ව ඕස්ට්‍රේලියානු රජයේ ආධාර යටතේ ක්‍රියාත්මක Skills for Inclusive Growth (S4IG) වැඩසටහන ක්‍රියාත්මක කිරීමත්, තොරතුරු තාක්ෂණ අංශයේ වෙබ් සහ යෙදුම් භාෂා දැනුම වර්ධනය කරගැනීම සඳහා ද, පුද්ගලික රෝහල් ක්ෂේත්‍රයට අවශ්‍ය නිපුණ ශිල්පීන් බිහිකිරීමේ අරමුණින් අප අධිකාරිය මෙම වසර තුළ දී විවිධ ආයතන සමඟ අවබෝධතා ගිවිසුම් වලට එළඹීමක් සිදුවිය. එපමණක් නොව පෞද්ගලික රෝහල් සාත්තු සේවා සංගමය (APNH) සහ පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන කොමිසම (PHSRC) ඒකාබද්ධව සංවිධානය කරන ලද පෞද්ගලික අංශය සඳහා අවශ්‍ය හෙද කාර්ය මණ්ඩලය පුහුණු කිරීමේ හෙද ඩිප්ලෝමා (NVQ 6) පාඨමාලාවේ තෙවන කණ්ඩායම බඳවා ගැනීම සාර්ථකව සිදුවිය.

රූපලාවණ්‍ය ක්ෂේත්‍රය යනු වර්තමානය වනවිට යෞවන යෞවනියන් වැඩි රුචිකත්වයක් දක්වන ක්ෂේත්‍රයකි. මෙහිදී නිපුණ කොණ්ඩා සැකසුම් ශිල්පීන් බිහිකිරීම සඳහා පෞද්ගලික අංශය සමඟ ගිවිසුම් අත්සන් තබන ලදී. තවද RPL ක්‍රමවේදය ඔස්සේ මනාලියන් හැඩගැන්වීමේ නිපුණ ශිල්පීන් හට NVQ සහතිකපත්‍ර ලබාදීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමට යොමුවිය.

එමෙන්ම උසස් පෙළ නාක්ෂණවේදය හැදෑරූ සිසුන්ට NVQ සහතික ලබාගැනීම සඳහා අවස්ථාව සැලසීමේ ජාතික වැඩසටහනත්, සූර්ය ප්‍රකාශ වෝල්ටීයතා කාර්මික ශිල්පී මාස 18 ක පූර්ණ කාලීන පාඨමාලාව සාර්ථකව අවසන් කළ සහතිකපත්ලාභීන් සඳහා සහතිකපත් පිරිනැමීම හා එහි දෙවන අදියර ආරම්භ කිරීමත්, රජයේ රැකියා ලක්ෂයේ ජාතික වැඩසටහනේ පළමු අදියර යටතේ පුහුණුව අවසන් කළ සහතිකපත්ලාභීන් සඳහා සහතිකපත් පිරිනැමීමත් දෙවන අදියර යටතේ තෝරා ගත් ප්‍රතිලාභීන් හට විදුලි වැට නඩත්තු සහායක ක්ෂේත්‍රයේ පුහුණුව ලබාදීම මඟින් රැකියා අවස්ථා උදාකරලීමේ වැඩසටහන ආරම්භ කිරීමත් මෙම වර්ෂය තුළ දී සිදුවිය.

එළඹෙන නව වර්ෂය වෙනුවෙන් විදේශීය රැකියා වෙළඳපොළ වෙත සෘජුව සම්බන්ධවිය හැකි නිපුණ ශිල්පීන් ද ප්‍රධාන පෙළේ ආයතන වෙත අවශ්‍ය දක්ෂ මෘදුකාංග ශිල්පීන් ද නව තාක්ෂණයෙන් පිරිපුන් බර වාහන ක්‍රියාකරුවන් බිහිකිරීම සඳහා මූලික අදියර දියත් කිරීමට අවශ්‍ය කටයුතු මෙම වසර තුළ සිදුවිය.

එමෙන්ම පසුගිය 2022 වර්ෂය පුරාවට අභියෝග සඳහා සාර්ථකව මුහුණ දෙමින් ආයතනික අරමුණු ළඟා කරගැනීමට දායක වූ මාගේ සහෘද කාර්ය මණ්ඩලය හා අප ආයතනයේ පුහුණුලාභීන්ට පුහුණු අවස්ථා සලසාදෙන රාජ්‍ය හා පෞද්ගලික ආයතන සඳහා ස්තූති කිරීමට මා මෙය අවස්ථාවක් ලෙස සලකමි.

ඩබ්. රුචික අමරසේකර
සභාපති

දැක්ම

මානව සම්පත් සංවර්ධනය මඟින් ශ්‍රී ලංකාවේ
සමෘද්ධිය සැලසීම සඳහා සාර්ථක දායකත්වයක් දෙමින්
කාර්යක්ෂම පුහුණු කිරීමේ ආයතනය බවට පත්වීම

මෙහෙවර

කර්මාන්ත ක්ෂේත්‍රයේ නිපුණ මිනිස් බල අවශ්‍යතා
සපුරාලනු පිණිස මනාසේ සකසන ලද උසස්ම වෘත්තීය
මට්ටමේ නිපුණතා පුහුණු වැඩසටහන් තුළින් තරුණ
තරුණියන් හට වෘත්තීය හා කාර්මික පුහුණුව ලබා දීම

අධිකාරියේ අරමුණු

සංස්ථාපිත කිරීමේ පනතෙහි අංක 37 (1) දරන ඡේදය අනුව අධිකාරියේ පරමාර්ථ පහත පරිදි වේ.

(අ) වෘත්තීය පුහුණුව සැලසුම් කිරීම, සංවිධානය කිරීම හා ලබාදීම.

(ආ) වෘත්තීය පුහුණුවට අදාළ පුහුණු සම්මතයන් නිශ්චය කිරීම.

(ඇ) වෘත්තීය පුහුණුවට අදාළව විභාග පැවැත්වීම හා සහතික පත්‍ර සහ වෙනත් ප්‍රදානයන් නිකුත් කිරීම.

(ඈ) ජාතික ශිල්පීය පරීක්ෂණය පැවැත්වීම.

(ඉ) වෘත්තීය පුහුණුව පිළිබඳ පර්යේෂණ හා සංවර්ධන කාර්යයන් කිරීම.

(ඊ) විවිධ දක්ෂතා වැඩිදියුණු කිරීම ප්‍රවර්ධනය පිණිස තරඟ පැවැත්වීම.

(උ) වෘත්තීය පුහුණුව සලස්වන ආයතනවල සහ වෙනත් ආයතනවල පුහුණු කිරීමේ හැකියාවන් සංවර්ධනය කිරීම.

(ඌ) වෘත්තීය පුහුණු කිරීම් සම්බන්ධයෙන් වෘත්තීය පුහුණු කොමිෂන් සභාවට උපදෙස් දීම.

(එ) සමාන පරමාර්ථ ඇති ශ්‍රී ලංකාවේ සහ විදේශවල පිහිටි ආයතන සමඟ සම්බන්ධකම් ඇති සහතික, ඩිප්ලෝමා සහ උපාධි සමතත්වයෙහිලා සැලකීම සඳහා අදාළ කටයුතු කිරීම සහ බලාත්මක කිරීම.

අධිකාරියේ ප්‍රධාන කාර්යයන් / වැඩසටහන්

(අ) රාජ්‍ය ආයතන සහ පෞද්ගලික ආයතන සමඟ සම්බන්ධ වී කර්මාන්ත පාදක ආධුනිකත්ව පුහුණුව ලබාදීම, ජාතික ආයතන 03ක් සහ දිවයිනපුරා පිහිටුවා ඇති ආධුනිකත්ව පුහුණු මධ්‍යස්ථාන මඟින් ද්විත්ව පුහුණුව ලබාදීම.

(ආ) වෙනත් වෘත්තීය පුහුණුවන්නන් සඳහා විවිධ ආයතන වලට යොමුකොට කාර්යස්ථ පුහුණුව ලබාදීම.

(ඇ) මොරටුව, පේරාදෙණිය සහ රුහුණු විශ්ව විද්‍යාලයන්හි ඉංජිනේරු උපාධි අපේක්ෂක සහ අනෙකුත් ඩිප්ලෝමා හදාරන සිසුන් සඳහා අවශ්‍ය යන්ත්‍රාගාර පුහුණුව ලබාදීම.

(ඈ) අවිධිමත් ලෙස නිපුණතාව ලැබූ කර්මාන්ත ශිල්පීන්ට පෙර ඇගයීම් ක්‍රමයට ජාතික වෘත්තීය සුදුසුකම් සහතික ලබාදීම, වෘත්තීයට අදාළ පරිදි සුදුසුකම් සහතික ලබාදීම සහ අදාළ ජාතික වෘත්තීය පරීක්ෂණ පැවැත්වීම.

(ඉ) වෘත්තීය පුහුණු ආයතනවල පුහුණුකරුවන් පුහුණු කිරීම.

(ඊ) පාසල් සිසුන්, පාසල් හැරගිය සහ අනෙකුත් ඉලක්ක කණ්ඩායම් සඳහා වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් පැවැත්වීම.

හැඳින්වීම

නෛතික ව්‍යූහය

1971 අංක 49 දරන ජාතික ආධුනිකත්ව ජාතික පනත යටතේ ජාතික ආධුනිකත්ව මණ්ඩලය ලෙස ආරම්භ කරන ලදුව 1990 අංක 20 දරන තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනත යටතේ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය ලෙස ස්ථාපිත විය.

1971 අංක 38 දරන මුදල් පනතේ 14 වන වගන්තිය අනුව අධිකාරිය විසින් වාර්ෂික වාර්තාව පිළියෙල කළ යුතුව ඇත.

මෙම වාර්තාවේ කොටස් 03ක් අඩංගු වන අතර පුහුණු වැඩසටහන් වල ප්‍රගතිය පිළිබඳ විස්තර, පුහුණුව සම්බන්ධව සංවර්ධන කටයුතු සහ වර්ෂයට අදාළ සංක්ෂිප්ත වාර්ෂික ගිණුම් වාර්තාව හා විගණකාධිපති වාර්තාවෙහි ඇතුළත් තොරතුරු අන්තර්ගතකොට මෙම වාර්තාව පිළියෙල කර ඇත.

2022 වාර්ෂික වාර්තාව පිළියෙල කිරීම සඳහා දිවයින පුරා ක්‍රියාත්මක වන දිස්ත්‍රික් කාර්යාල 25 හි කළමණාකරුවන් හා ජාතික ආයතන වල ආයතන ප්‍රධානීන් මෙන්ම ප්‍රධාන කාර්යාලයෙහි ඒ ඒ අංශයන්හි අංශ ප්‍රධානීන් විසින් ලබා දුන් තොරතුරු පදනම් කොට ගන්නා ලදී. එම තොරතුරු විශ්ලේෂණය කර සංක්ෂිප්තව මෙම වාර්තාව සකස් කර ඉදිරිපත් කරන ලදී.

මෙහෙයුම් ක්‍රියාවලිය

1990 අංක 20 දරන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනත අනුව ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරියට ලැබී ඇති බලතල අනුව එම පනතෙහි අංක 37(1) දරන ඡේදයේ ප්‍රකාරව සකස් කළ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා අධිකාරිය තම මෙහෙයුම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කරනු ලබයි.

මේ සඳහා පුහුණු සංකල්ප යටතේ ජාතික ආයතන 03ක්, දිස්ත්‍රික් කාර්යාල 25ක්, පුහුණු අනුබද්ධ ආයතන හා අනෙකුත් රාජ්‍ය හා පෞද්ගලික අංශ දායක කරගත් කර්මාන්ත ආශ්‍රිත පුහුණුව ලබාදීම සිදු කරයි.

පුහුණුව සඳහා බඳවා ගැනීම, සුපරීක්ෂණය, අධීක්ෂණය, සහතිකකරණය ආදී අංශ ගණනාවක් යටතේ සෘජුවම පුහුණු මෙහෙයුම් කටයුතු සිදු වේ. ඊට අමතරව කළමනාකරණය හා පරිපාලනය, සේවක පුහුණුව, යටිතල පහසුකම් සංවර්ධනය මූල්‍ය හා විගණනය ඊට ඇතුළත් වේ.

පාලක මණ්ඩලය

2022 අගෝස්තු 26 සිට

රුචික අමරසේකර මහතා,
සභාපති,
ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය,
971, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
වැලිකඩ, රාජගිරිය.

මහාචාර්ය මහින්ද රූපසිංහ මහතා,
උප සභාපති
ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය,
971, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
වැලිකඩ, රාජගිරිය.

ආචාර්ය කේ.ඒ. ලලිතධීර මහතා,
අධ්‍යක්ෂ ජනරාල්
තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
අංක 354/2, ඇල්විටිගල මාවත
කොළඹ 05.

එම්.ඒ.එස්.මධුශංක මහතා
නියෝජ්‍ය අධ්‍යක්ෂ
රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
මුදල් අමාත්‍යාංශය
ලේකම් කාර්යාලය, කොළඹ 01.

නෙවිල් අබේරත්න මහතා
ජනාධිපති නීතිඥ
අංක 137, නාගහවත්ත පාර
දළුගම, කැලණිය.

ඩී.ආර්.සෝමවර්ධන මහතා
කථිකාචාර්ය 1 ශ්‍රේණිය – ICBT Campus
අංක 345/12, 3 වැනි හරස් වීදිය
කෝට්ටේ පාර.

දුෂ්මන්ත එම්. සුබසිංහ මහතා
කළමනාකාර අධ්‍යක්ෂ
පත්මා මෝටර් ස්ටෝර්ස් (පුද්ගලික) සමාගම
අංක 670/2, මංකඩ පාර
කඩවත.

ආචාර්ය කාංචන සිල්වා
"ජනහිරු"
නීතිඥ
අංක 129/8 බී,
අනගාරික ධර්මපාල මාවත
මහනුවර.

ඒ.සිදත් රෝහණ වෛද්‍යසේකර මහතා
අධ්‍යක්ෂ
අංක 788/1/ඒ, 3 වන පටුමග
මුවන්හැලවත්ත
මාලඹේ.

කේ.ජී.විමලසේන මහතා
විශ්‍රාමික විදුහල්පති
අංක 262/1ඒ, පන්සල පාර
තලපත්පිටිය
නුගේගොඩ

පරාක්‍රම ජේ.කේ.එස්.ඩබ්ලිව්. වික්‍රමසිංහ මහතා
ජනාධිපති ඔම්බුඩ්ස්මන්
අංක 32, ගල්මඩුවවත්ත
කුණ්ඩසාලේ.

වෛද්‍ය රංජිත් පීරිස් (MBBS/MD)
උපදේශක - ශ්‍රී ලංකා ජාතික රෝහලේ, කොළඹ,
ආමාශ ආන්ත්‍ර රෝග විශේෂඥ
ශ්‍රී ලංකාවේ ජාතික රෝහල
කොළඹ.

අයි.එස්.එන්.පෙරේරා මහතා
සහකාර සාමාන්‍යාධිකාරී (ගිණුම්කරණය සහ බදු)
ලංකා බැංකුව
ප්‍රධාන කාර්යාලය
කොළඹ 01.

එම් එල් දෂිත නිරෝෂණ මහතා
අධ්‍යක්ෂ (නිපුණතා සංවර්ධන)
අධ්‍යාපන අමාත්‍යාංශය
(නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන,
පර්යේෂණ සහ නව නිපැයුම් අංශය)
354/2, ඇල්විටිගල මාවත
කොළඹ 05.

2022 අගෝස්තු 26 දක්වා

තරංග නලීන් ගම්ලත් මහතා,
සභාපති,
ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය,
971, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
වැලිකඩ, රාජගිරිය.

මහාචාර්ය මහින්ද රූපසිංහ මහතා,
උප සභාපති
ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය,
971, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
වැලිකඩ, රාජගිරිය.

ආචාර්ය කේ.ඒ. ලලිතධීර මහතා,
අධ්‍යක්ෂ ජනරාල්
තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
අංක 354/2, ඇල්විටිගල මාවත, කොළඹ 05.

එම්.ඒ.එස්.මධුශංක මහතා
සහකාර අධ්‍යක්ෂ
රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
මුදල් අමාත්‍යාංශය
ලේකම් කාර්යාලය
කොළඹ 01.

හසිත ඒකනායක මහතා
වෘත්තීය ගුරු (සංයුක්ත ගණිතය)
අංක 79/5, මොරගහමුල
මැදමහනුවර, මහනුවර.

මොහොමඩ් මික්දාඩ් මහතා
වෘත්තීය කථිකාචාර්ය
Avro උසස් අධ්‍යාපන ආයතනයේ කළමනාකාර
අධ්‍යක්ෂ
අංක 89/2, දෙහිවල පාර
පැපිලියාන, බොරලැස්ගමුව.

ජානක කමල්ගොඩ මහතා
ප්‍රධාන විධායක නිලධාරී, දකුණු ආසියානු
ජාත්‍යන්තර උසස් අධ්‍යාපන
සභාපති, දකුණු ආසියානු ජාත්‍යන්තර මුල්
ළමාවිය රැකවරණ සහ සංවර්ධන සංගමය
අංක 136 1/2, පැරණි කැස්බෑව පාර
ගංගොඩවිල, නුගේගොඩ.

එස්.කේ.වයි.පී.එස්.කේ.සෙනරත් මහතා
නීතිඥ
අංක 309, කොළඹ පාර, ගම්පහ.

එස්.ඒ.ඩී.තිලක් ප්‍රේමලාල් මහතා,
අධ්‍යක්ෂ මණ්ඩල නිලධාරී
අංක 123/1ඒ, දුම්රියපොළ පාර,
ගංගොඩවිල,
නුගේගොඩ.

සහන් ද සිල්වා මහතා,
අංක 1009/18, 8 වැනි පටුමග,
සුමුදු මාවත,
මාලබේ.

ක්‍රිෂාන් සියඹලාපිටිය මහතා,
හිටපු ජනමාධ්‍ය කැබිනට් අමාත්‍යවරයාගේ
සම්බන්ධීකරණ ලේකම්

ඩබ්ලිව්.වී.පී.විජේසිරි මහතා
කළමනාකාර අධ්‍යක්ෂ, වෛද්‍ය රක්ෂණ
මධ්‍යස්ථානය
අධ්‍යක්ෂ, බස්නාහිර පළාත් ආර්ථික සංවර්ධන
ජ්‍යෙෂ්ඨ මූල්‍ය උපදේශක, ශ්‍රී ලංකා රක්ෂණ
සංස්ථාව
අංක 03, සෞභාග්‍ය උද්‍යානය,
කොහිලකොරටුව පාර, මහරගම.

ඕ.ප්‍රියංගිකා සිගේරා මෙනවිය
පෙර පාසල් විදුහල්පති/ හිටපු බැංකුකරු
අංක 25/1, චන්ද්‍රා වෙත්තසිංහ මාවත,
කොස්වත්ත පාර, නාවල.

ඩී.එම්.නිරන්ජන් දිසානායක මහතා
කළමනාකරු ෆෙරේරෝ ලංකා (පුද්ගලික)
සමාගම
සභාපති ආනයන අංශය
ලංකා වාණිජ මණ්ඩලය
අංක 126/4ඒ, ස්ටැන්ලි තිලකරත්න මාවත,
නුගේගොඩ.

පී.සමන්ත කුමාර මහතා
අධ්‍යක්ෂ මණ්ඩල නිලධාරී
කුඩිරිප්පුව,
ගල්මුරුව,
මාදම්පේ.

එම්.එල්.ඩී.නිරෝෂණ මහතා
අධ්‍යක්ෂ (නිපුණතා සංවර්ධන)
රේඛීය අමාත්‍යාංශයේ නිරීක්ෂක සාමාජික

අධ්‍යක්ෂ මණ්ඩල නිලධාරීන්

1. තරංග නලීන් ගම්ලත් මහතා	සභාපති (2022.01.01 - 2022.08.25)
2. රුවික අමරසේකර මහතා	සභාපති (2022.08.26 සිට මේ දක්වා)
3. මහාචාර්ය මහින්ද රූපසිංහ මහතා	උප සභාපති (2022.01.01 - 2022.11.03)
4. එස්. එච්. හරිස්චන්ද්‍ර මහතා	උප සභාපති (2022.11.22 සිට මේ දක්වා)
5. ආචාර්ය ඩබ්ලිව්.එම්.එස්. විජේසිංහ	අධ්‍යක්ෂ ජනරාල්
6. පී.ආර්. රොද්‍රිගෝ මහතා	අධ්‍යක්ෂ (සැලසුම් හා අධීක්ෂණ)
7. සුමේධ ජයසිංහ මහතා	අධ්‍යක්ෂ (පරිපාලන හා මානව සම්පත්)
8. ඩබ්ලිව්.එම්.ඒ.කේ. වීරසේකර මහතා	අධ්‍යක්ෂ (මුදල්) (2022.04.18 සිට මේ දක්වා)
9. ජී.එච්.වී.එන්.ඩබ්. ද සිල්වා මහතා	නියෝජ්‍ය අධ්‍යක්ෂ / අධ්‍යක්ෂ (පුහුණු) වැ.බ. (2019.07.10 සිට මේ දක්වා)
10. සී.පී. සුබසිංහ මහතා	සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) අධ්‍යක්ෂ (තත්ත්ව) වැ.බ. (2021.11.23 දින සිට මේ දක්වා)
11. එන්.ඩබ්ලිව්.එන්. සඳමාලි මහත්මිය	අභ්‍යන්තර විගණක / අධ්‍යක්ෂ (මුදල්) රා.ඉ. (2020.06.11 - 2022.04.17)
12. ටී.පී.කේ. පෙරේරා මහතා	නියෝජ්‍ය අධ්‍යක්ෂ (තත්ත්ව)
13. එස්.වී.පී. වික්‍රමසිංහ මහතා	සහකාර අධ්‍යක්ෂ (ඇගයීම්)
14. ඩබ්ලිව්.ඒ.කේ.එස්. කුමාර මහතා	සහකාර අධ්‍යක්ෂ (කාර්යස්ථ පුහුණු)
15. ඒ.ජේ. පතිරණ මහතා	සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ)
16. එම්.එල්.පී. ප්‍රනාන්දු මහතා	සහකාර අධ්‍යක්ෂ (වෘත්තීය මාර්ගෝපදේශන හා අලෙවි)
17. ජී.පී. සුනිල් මහතා	සහකාර අධ්‍යක්ෂ (NSS)
18. ආර්.ඩබ්.එම්.ඒ.ජේ. රත්නායක මහතා	සහකාර අධ්‍යක්ෂ (පර්ෂද)
19. යූ.එම්. ප්‍රබෝෂිනී මහත්මිය	සහකාර අධ්‍යක්ෂ (ගිණුම් හා පාලන)
20. එන්.ඩී.පී. උස්ගොඩාරච්චි මහතා	සහකාර අධ්‍යක්ෂ (පරිපාලන හා සැපයුම්)
21. පී.එම්. විතානගේ මහත්මිය	සහකාර අධ්‍යක්ෂ (පුහුණු සේවා)
22. ඒ.එච්.එස්.පී. විජේරත්න මහතා	සහකාර අධ්‍යක්ෂ (අධීක්ෂණ)
23. කේ.ඒ.එස්.එස්.ජයසිංහ මහතා	සහකාර අධ්‍යක්ෂ (විශේෂ කාර්යස්ථ පුහුණු)
24. පී.එස්.ඩබ්ලිව්. දිසානායක මහතා	සහකාර අධ්‍යක්ෂ (මානව සම්පත් කළමනාකරණ)
25. එච්.එම්.බී.ඒ.කේ.විජේරත්න මහත්මිය	සහකාර අධ්‍යක්ෂ (සහතික) පුහුණු නිලධාරි - ශ්‍රේණිය III
එස්.කේ. වික්‍රමආරච්චි මහතා	සහකාර අධ්‍යක්ෂ (මානව සම්පත් සංවර්ධන) වැ.ආ.(2022.09.01 දින සිට මේ දක්වා)
26. ඩී.ආර්. සපුතන්ත්‍රී මහතා	අධ්‍යක්ෂ/ විදුහල්පති - IET
27. එච්.ඒ.එන්.ඩී. කුමාරි මහත්මිය	සහකාර අධ්‍යක්ෂ (නඩත්තු හා සිවිල්) වැ.ආ. (2021.12.01 දින සිට)
28. එම්.එච්.එන්.පී.ධර්මසිරි මහතා	නියෝජ්‍ය අධ්‍යක්ෂ/ අධ්‍යක්ෂ විදුහල්පති (වැ.ආ.) - IETI
29. ඩී.එල්.ඒ.කේ.දිසානායක මහතා	පුහුණු නිලධාරි - ශ්‍රේණිය II අධ්‍යක්ෂ/ විදුහල්පති (වැ.ආ.) - AETI


දිස්ත්‍රික් කළමනාකරුවන්

1. එස්.ඩී.අබේවික්‍රම මහතා	හම්බන්තොට
2. ඒ. මසූර් මහතා (2022.11.22 දින විශ්‍රාම ගන්නා ලදී) එම්.සී.එම්.අබේසුන්දර මහතා (වැ.ආ.) (2022.11.23 දින සිට)	අම්පාර
3. ඩී.ඩී. පියලත් මිය (2022.06.13 දින විශ්‍රාම ගන්නා ලදී) බී.එම්.ජේ.එස්.කේ. රණාරාජා මහතා (2022.06.06 දින සිට)	කෑගල්ල
4. එම්.ආර්.ඩී.ඒ.එස්.ගුණාරත්න මහතා	කොළඹ
5. යූ.එම්.කේ.නානායක්කාර මහතා	මාතර
6. පී.කේ.පී.ගුණවර්ධන මහතා	බදුල්ල
7. පී. නාරන්ගොඩ මහතා	ගාල්ල
8. ටී.ජී.එස්. ජයලත් මහතා	කළුතර
9. එස්.ඒ.එස්.එම්. සලීම් මවුලානා මහතා	මඩකලපුව
10. එස්. විනස් මහතා (2022.06.31 දින දක්වා මන්නාරම් දිස්ත්‍රික් කළමනාකරු ලෙසත් 2022.06.01 දින සිට මේ දක්වා කිලිනොච්චි දිස්ත්‍රික් කළමනාකරු ලෙසත් රාජකාරී කටයුතු සිදු කරයි)	මන්නාරම කිලිනොච්චි
11. එස්.තීපන් මහතා (වැ.ආ.)	මන්නාරම
12. එස්. පී. සී.ජේ. මෛත්‍රීදාස මහතා	මොණරාගල
13. ආර්.එම්.එන්.එස්.කේ. රත්නායක මහතා	පුත්තලම
14. ජී.ටී. රත්නකුමාර මහතා (වැ.ආ.) (2022.07.31 දින දක්වා) ආර්.තිරුමුරුඛන් මහතා (2022.08.01 දින සිට)	යාපනය
15. එස්.සිවගෞරි මිය	මුලතිව්
16. කේ.කේ. නිශ්ශංක මිය	කුරුණෑගල
17. ඕ.කේ.ජී.ඒ.සමන් කුමාර මහතා	මහනුවර
18. අයි.එම්.යූ.එස්.කේ. ඉලංගකෝන් මිය	මාතලේ
19. ටී.එම්.ටී.බී.කරුණාරත්න මහතා (වැ.ආ.)(2022.07.31 දින දක්වා) එස්.එස්. සෙනෙවිරත්න මහතා (2022.08.01 දින සිට)	අනුරාධපුර
20. පී.ආර්. කුමාරසිංහ මහතා (2022.08.01 දින සිට)	ගම්පහ
21. එස්. සුබාෂ් මහතා (වැ.ආ.)(2022.07.31 දින දක්වා) වයි.යෝකේස්වරන් මහතා (වැ.ආ.)	වව්නියාව
22. යූ.ජී.එන්.සමීර මහතා (වැ.ආ.)	පොලොන්නරුව
23. වයි.එස්.පියතිලක මහතා (වැ.ආ.)	රත්නපුර
24. කේ.පත්මනාදන් මහතා	ත්‍රිකුණාමලය
25. ඩී.ඒ.ඩී.සූරියබණ්ඩාර මහතා (වැ.ආ.)	නුවරඑළිය

National Apprentice & Industrial Training Authority
Organizational Structure
Board Of Management
Chairman /CEO
Vice Chairman
Director General
Director Admin. & H.R.
Director Training
Institutes/ Districts
Director Quality
Director Planning & Monitoring
Director Finance
Internal Auditor
I.A.O
M.A.
Office Aide
A.D. Admin
VRU Officer
Proc. Officer
Trp. Officer
M.A.
Drivers
A.D. Maint.& Civil .
Tech. Officer
Drft.M. M.A.
Office Aide
A.D. HRM
A.O.
Transl ator.
M.A.
M.A.
Office Aide
A.D. HRD
T.O.
T.O.
Office Aide
A.D. Training Service
Inspec
Inspec
Management Asst.
Office Aide
A.D. Training
T.O.
Inspec
Inspec.
A.D. Cluster
T.O.
Inspec.
Inspec.
A.D. SIT
T.O.
Inspec.
Inspec.
A.D. OJT
T.O.
Inspec
Inspec
A.D. C.G.& Marketing
T.O.
Inspec
Inspec
A.D. Quality
Q.A. Off.
Inspec.
Inspec.
Management Asst.
Office Aide
A.D. NSS
T.O.
Inspec
Inspec
A.D. Assess ment
T.O.
Inspec.
Inspec.
A.D. Certifi cate
T.O.
Inspec.
Inspec.
A.D. Information Systems
Sys. Adm
Inspec.
Inspec.
A.D. Planning & Develop.
D.B Adm
Stat. cian
Inspec.
Inspec.
A.D. Monito ring
T.O.
Inspec.
Inspec.
Management Asst.
Office Aide
A.D. Acc. & Controll
Acct. Officer
Acct. Officer
Acct. Officer
Book Keeper
Management Asst.
Office Aide
B/ Sec Leg.Off

දත්ත නිරූපණය සහ විශ්ලේෂණය

ප්‍රස්ථාරය 1 ඃ පුහුණු කිරීමේ කාර්යයන්හි සාරාංශය (වසර 18ක් තුළ)



පසුගිය වසර 18ක් තුළ ආයතනික බඳවා ගැනීම, පුහුණුව හැර යාම. පුහුණුව සම්පූර්ණ කිරීම සහ පුහුණුවේ නිරත වීම පිළිබඳ සංක්ෂිප්ත විශ්ලේෂණයක් ඉහත ප්‍රස්තාරය මඟින් නිරූපණය වේ. ආයතනික බඳවා ගැනීම සලකා බලන විට පෙර වසර වලදී එහි අඛණ්ඩ වර්ධනයක් පෙන්නුම් කළත් 2020 හා 2021 වසර තුළදී සීඝ්‍ර අඩු වීමක් පෙන්නුම් කරයි. කෙසේ නමුදු නැවතත් බඳවා ගැනීම්වල සීඝ්‍ර වර්ධනයක් කර ළඟා වීමට මෙම වසරේ දී හැකි විය. ආධුනිකයින් පුහුණුව හැර යාම පෙර වසර වලට සාපේක්ෂව සාමාන්‍ය මට්ටමක පවතී. ආධුනිකයින් පුහුණුව සම්පූර්ණ කිරීම සහ පුහුණුවේ නිරත වෙමින් පැවතීම පෙර වසරට සාපේක්ෂව වර්ධනයක් පෙන්නුම් කරයි.

වගුව 1 : මධ්‍යස්ථාන, කර්මාන්ත පාදක ආධුනිකත්ව පුහුණුව හා ජාතික ආයතනවල ආධුනිකයින් ඉලක්ක කරා ලඟා වීමේ ප්‍රගතිය නිරූපණය

පුහුණු වර්ගය		ඉලක්ක	බඳවාගැනීම්	බඳවාගැනීම් ප්‍රතිශතය
කර්මාන්ත පාදක ආධුනිකත්ව පුහුණුව				
ජාතික වෘත්තීය සුදුසුකම		15,090	13,931	**92.3%**
කර්මාන්ත ශිල්පී		4,040	2,736	**67.7%**
ස්ථානානුරූපී		1,975	1,093	**55.3%**
ග්‍රාමීය මට්ටම		855	510	**59.6%**
විශේෂ පුහුණුව (ASTA, බන්ධනාගාර, ආබාධිත පුද්ගලයන්)		240	167	**69.6%**
13න් වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන		800	602	**75.3%**
බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකාය		65,200	3,543	**5.4%**
මධ්‍යස්ථාන පාදක ආධුනිකත්ව පුහුණුව				
පූර්ණ කාලීන	ජාතික වෘත්තීය සුදුසුකම	3,245	2,678	**82.5%**
	ජාතික වෘත්තීය සුදුසුකම නොවන	755	245	**32.5%**
අර්ධ කාලීන		1,000	391	**39.1%**
ජාතික ආයතන				
පූර්ණ කාලීන		1,450	1,269	**87.5%**
අර්ධ කාලීන		550	983	**178.7%**
				වෙනත්
විශේෂ කර්මාන්ත පුහුණුව		15,000	13,561	**90.4%**
රැකියාස්ථ පුහුණුව	රාජ්‍ය පෞද්ගලික අංශය	20,000	9,797	**60.9%**
	13න් වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන		631	
	උසස් පෙළ තාක්ෂණවේදය හැදෑරූ සිසුන් සඳහා		1,742	
එකතුව		**130,200**	**53,879**	**41.4%**

සමාලෝචිත වර්ෂය තුළ විවිධ පුහුණු පාඨමාලා සඳහා ආයතනික බඳවා ගැනීම ආයතනය විසින් අරමුණු ඉලක්ක ලඟා කර ගැනීමේ ප්‍රගතිය මෙමඟින් නිරූපණය කෙරේ.

මෙම වසරේ 53,879ක් වූ මුළු ආධුනිකයින් සංඛ්‍යාවක් බඳවා ගනිමින් 41.4%ක ඉලක්කයක් සම්පූර්ණ කරගැනීමට හැකි විය. එහිදි සමස්තයක් වශයෙන් බොහෝ පුහුණු පාඨමාලා සඳහා 50%කට වඩා වූ අපේක්ෂිත ඉලක්ක කරා ළඟා වීමට හැකි වී ඇති බව නිරූපණය වේ. ජාතික ආයතනයන්හි අර්ධ කාලීන පාඨමාලාවන් සඳහා අපේක්ෂිත මට්ටමට වඩා ඉහළ බඳවා ගැනීමක් සිදු කිරීමට හැකි විය.

වගුව 2 : පුහුණු කිරීම් කාර්යයන්හි ප්‍රගතිය පෙර වර්ෂය හා සැසඳීම

2022		බඳවාගැනීම්		පුහුණුව හැරයාම්		පුහුණුව සම්පූර්ණ කිරීම්		පුහුණුවේ රැඳී සිටින සංඛ්‍යාව	
		2021	2022	2021	2022	2021	2022	2021	2022
කර්මාන්ත පාදක ආධුනිකත්ව පුහුණුව									
ජාතික වෘත්තීය සුදුසුකම		7,115	13,931	1,221	3,798	4,541	5,301	8,142	12,974
කර්මාන්ත ශිල්පී		2,419	2,736	645	837	1,879	1,686	3,330	3,543
ස්ථානානුරූපී		823	1,093	95	217	353	913	735	698
ග්‍රාමීය මට්ටම		359	510	81	138	186	408	252	216
විශේෂ පුහුණු වැඩසටහන (බන්ධනාගාර, ආබාධිත පුද්ගලයන්)		3,263	167	222	47	4,045	459	409	70
මධ්‍යස්ථාන පාදක ආධුනිකත්ව පුහුණුව									
පූර්ණ කාලීන	ජාතික වෘත්තීය සුදුසුකම	2,282	2,678	222	427	1,137	2,057	2,363	2,557
	ජාතික වෘත්තීය සුදුසුකම නොවන	233	245	37	79	177	188	230	208
අර්ධ කාලීන		93	391	-	3	70	319	42	111
ජාතික ආයතන									
පූර්ණ කාලීන		390	1,269	352	315	925	1,100	2,545	2,399
අර්ධ කාලීන		300	983	101	1	300	809	-	173
එකතුව		**17,277**	**24,003**	**2,976**	**5,862**	**13,613**	**13,240**	**18,048**	**22,949**
වෙනත්									
විශේෂ කර්මාන්ත පුහුණුව		5,439	13,561	-	-	4,696	8,812	2,563	7,312
රැකියාස්ථ පුහුණුව		6,690	9,797	1,945	1,286	5,581	6,687	572	2,396
එකතුව		**29,406**	**47,361**	**4,921**	**7,148**	**23,890**	**28,739**	**21,183**	**32,657**

***පුහුණුව සම්පූර්ණ කිරීම් සහ පුහුණුව හැරයාම තුළ පෙර වර්ෂවල බඳවාගත් ආධුනිකයින්ද ඇත.

විවිධ පුහුණු ක්‍රමවේදයන් තුළ පුහුණු කිරීම් කාර්යයන්හි ප්‍රගතිය සංසන්දනය ඉහත වගුව මඟින් නිරූපණය වේ. එහිදී 47,361ක් වූ සමස්ත ආධුනික බඳවා ගැනීමක් සිදු කරමින් 61% ක වර්ධනයක් පෙර වසරට සාපේක්ෂව පෙන්නුම් කෙරේ. පෙර වසර හා සැසඳීමේදී පුහුණුව හැරයාමෙහි සුළු වැඩිවීමක් පෙන්නුම් කරයි. පුහුණුව සම්පූර්ණ කිරීම ගත්කළ පුහුණුව සාර්ථකව සම්පූර්ණ කිරීම පෙර වසරට සාපේක්ෂ 20%කට ආසන්න වර්ධනයකි. ජාතික ආයතන සඳහා බඳවාගැනීම සමාලෝචිත වර්ෂය තුළදී සාධනීය ප්‍රගතියක් පෙන්නුම් කරයි. 2021 වසර වන විට 21,183ක් පුහුණුවෙහි නිරත වෙමින් සිටිය අතර 2022 වසර අවසන් වන විට 32,657ක ආධුනිකයින් සංඛ්‍යාවක් අප ආයතනය තුළ විෂය පාඨමාලාවන්ට අදාළව ආධුනිකත්ව පුහුණුව ලබමින් සිටී.


වගුව 3 : පුහුණු කිරීම් කාර්යයන්හි සාරාංශය (විවිධ පුහුණු වර්ගීකරණයන්) 2022

2022	බඳවා ගැනීම්			පුහුණුව හැරයාම්			පුහුණුව සම්පූර්ණ කිරීම්			පුහුණුවේ රැඳී සිටින සංඛ්‍යාව		
	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව
කර්මාන්ත පාදක ආධුනිකත්ව පුහුණුව												
ජාතික වෘත්තීය සුදුසුකම (NVQ)	7,472	6,459	13,931	2,199	1,599	3,798	3,101	2,200	5,301	7439	5535	12,974
කර්මාන්ත ශිල්පී	1,206	1,530	2,736	441	396	837	805	881	1,686	1956	1587	3,543
ස්ථානානුරූපී	537	556	1,093	111	106	217	432	481	913	382	316	698
ග්‍රාමීය මට්ටම	59	451	510	13	125	138	78	330	408	20	196	216
විශේෂ පුහුණු වැඩසටහන (බන්ධනාගාර/ආබාධිත)	158	9	167	47	-	47	457	2	459	61	9	70
එකතුව	9,432	9,005	18,437	2,811	2,226	5,037	4,873	3,894	8,767	9,858	7,643	17,501
මධ්‍යස්ථාන පාදක ආධුනිකත්ව පුහුණුව												
ජාතික වෘත්තීය සුදුසුකම (NVQ)	795	1,883	2,678	152	275	427	512	1545	2,057	815	1742	2,557
ජාතික වෘත්තීය සුදුසුකම නොවන (Non NVQ)	14	231	245	5	74	79	2	186	188	12	196	208
අර්ධ කාලීන	88	303	391	3	-	3	61	258	319	30	81	111
එකතුව	897	2,417	3,314	160	349	509	575	1,989	2,564	857	2,019	2,876
ජාතික ආයතන												
පූර්ණ කාලීන	1,069	200	1,269	272	43	315	944	156	1,100	1,974	425	2,399
අර්ධ කාලීන	946	37	983	1	-	1	796	13	809	149	24	173
එකතුව	**2,015**	**237**	**2,252**	**273**	**43**	**316**	**1,740**	**169**	**1,909**	**2,123**	**449**	**2,572**
වෙනත්												
විශේෂ කර්මාන්ත පුහුණුව	7,991	5,570	13,561	-	-	-	5,242	3,570	8,812	4,320	2,992	7,312
රැකියාස්ථ පුහුණුව	4,861	4,936	9,797	313	401	714	3,038	3,649	6,687	1,510	886	2,396
එකතුව	12,852	10,506	23,358	313	401	714	8,280	7,219	15,499	5,830	3,878	9,708
මුළු එකතුව	**25,196**	**22,165**	**47,361**	**3,557**	**3,019**	**6,576**	**15,468**	**13,271**	**28,739**	**18,668**	**13,989**	**32,657**

***පුහුණුව සම්පූර්ණ කිරීම් සහ පුහුණුව හැරයාම තුළ පෙර වර්ෂවල බඳවාගත් ආධුනිකයින්ද ඇත.


සමාලෝචිත වර්ෂය තුළදී විවිධ පුහුණු ක්‍රමවේදයන් යටතේ ස්ත්‍රී පුරුෂභාවය අනුව ආධුනිකයින්ට පුහුණුවට බඳවාගැනීම, පුහුණුව හැරයාම, පුහුණුව සම්පූර්ණ කිරීම සහ තවදුරටත් පුහුණුවේ නිරත වීම ව්‍යාප්ත වී ඇති අයුරු වගුව මඟින් නිරූපණය වේ. 47,361ක් වූ සමස්ත ආධුනික බඳවා ගැනීම මෙම වසරේදී සිදු කිරීමට හැකි වී ඇති අතර එයින් 25,196ක් පිරිමි ආධුනිකයින් වන අතර 22165ක් කාන්තා ආධුනිකයින් වේ. එහිදී කර්මාන්ත පුහුණුව යටතේ කාන්තා සහ පිරිමි ආධුනික බඳවා ගැනීමෙහි සැලකිය යුතු වෙනසක් නොපෙනුනත් මධ්‍යස්ථ පාදක ආධුනිකයින් පුහුණු ක්‍රමවේදය යටතේ පිරිමි ආධුනිකයින්ගේ සහභාගිත්වය සැලකිය යුතු ලෙස අඩු වී ඇත. ජාතික ආයතන සඳහා මෙම වසරේ 2,252ක් ආධුනිකයින් බඳවා ගෙන ඇත. 6576ක් වූ ආධුනිකයින් සංඛ්‍යාවක් පුහුණුව හැර ගොස් ඇති අතර 28,739ක් පුහුණුව සාර්ථකව නිම කර ඇත. කර්මාන්ත පාදක පුහුණු ක්‍රමවේදය, මධ්‍යස්ථාන පාදක පුහුණුව සහ ජාතික ආයතන යටතේ පිළිවෙලින් 17,501ක්, 2876ක් සහ 2,572ක් වූ ආධුනිකයින් තවදුරටත් අප ආයතනයේ පුහුණුව ලබමින් සිටී.

ප්‍රස්ථාරය 2 : ස්ත්‍රී පුරුෂ භාවය අනුව පුහුණුවට ඇතුළත් වීම



සමාලෝචිත වර්ෂය තුළ ස්ත්‍රී පුරුෂ වශයෙන් ආධුනිකයින් බඳවා ගැනීම මෙම ප්‍රස්තාරය මඟින් නිරූපණය වේ. එහිදී මුළු ආධුනිකයින්ගෙන් 53%ක් පිරිමි ආධුනිකයින් නියෝජනය කරන අතර 47%ක් කාන්තා ආධුනිකයින් වේ.

ප්‍රස්ථාරය 3 : ජාතික ආධුනිකත්ව පුහුණුව (අර්ධකාලීන ආධුනිකත්ව පුහුණුව හැර)



2022 වර්ෂයේදී ජාතික වෘත්තීය සුදුසුකම් සහ අනෙකුත් පුහුණු කිරීම් යටතේ ආධුනිකයින් බඳවා ගැනීම ප්‍රස්ථාරය මඟින් නිරූපණය වේ. සමස්තයක් ලෙස ගත්කළ ජාතික වෘත්තීය සුදුසුකම් යටතේ ආධුනිකයින් පුහුණු ක්‍රමවේදයන්ට අනුයුක්ත වීමට වැඩි නැඹුරුතාවයක් දක්වා ඇති බව ප්‍රස්තාරය මඟින් වටහා ගත හැක. එහිදී කර්මාන්ත පාදක පුහුණු ක්‍රමවේදය තුළින් 13,974ක් වූ ආධුනිකයින් ජාතික වෘත්තීය සුදුසුකම් යටතේ පුහුණු කිරීමට අප ආයතනය හා සම්බන්ධ වී ඇත. එය ප්‍රතිශතයක් ලෙස ගත් කළ 76%කි. ප්‍රතිශතාත්මකව 24%ක් නියෝජනය කරමින් ජාතික වෘත්තීය සුදුසුකම් නොවන පාඨමාලා සඳහා බඳවා ගෙන ඇත. මධ්‍යස්ථ පාදක පුහුණුව යටතේ ජාතික වෘත්තීය සුදුසුකම් සඳහා ආධුනිකයින් 2,678ක් සහ ජාතික ආයතන සඳහා 1,213ක් වූ ආධුනික පිරිසක් යොමු වී ඇත.

වගුව 4 : ජාතික ආයතන වල ප්‍රගතිය (පූර්ණ කාලීන පාඨමාලා)

දිස්ත්‍රික්කය	ඉලක්ක	බඳවා ගැනීම්			පුහුණුව හැරයාම්			පුහුණුව සම්පූර්ණ කිරීම්			පුහුණුවේ රැඳී සිටින සංඛ්‍යාව		
		පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව
ජාතික ආයතන													
මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය - මරුගොඩවත්ත	450	453	19	472	106	13	119	363	16	379	642	19	661
කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය - කටුබැද්ද	500	482	111	593	159	26	185	300	60	360	559	83	642
ඉංජිනේරු තාක්ෂණ ආයතනය - කටුනායක	500	134	70	204	7	4	11	281	80	361	773	323	1096
එකතුව	**1,450**	**1,069**	**200**	**1,269**	**272**	**43**	**315**	**944**	**156**	**1,100**	**1,974**	**425**	**2,399**

සමාලෝචිත වර්ෂය තුළදී ජාතික ආයතන තුන යටතේ ආධුනික බඳවා ගැනීම, පුහුණුව හැරයාම සහ පුහුණුව සාර්ථකව නිම කිරීම සහ පුහුණුවේ තවදුරටත් නිරත වීම වගුව මඟින් නිරූපණය කෙරේ. මෙම වසරේදී කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය වැඩිම ආධුනික සංඛ්‍යාවන් බඳවා ගෙන ඇති අතර එය ජාතික ආයතන සඳහා බඳවා ගත් සමස්ත මුළු ආධුනික සංඛ්‍යාව වන 1,269න් 47%ක ප්‍රමාණයකි. ජාතික ආයතන තුනෙහි සිසුන් 1,100 මෙම වසරේදී පුහුණුව සාර්ථකව නිම කර ඇති අතර 2,399ක් වූ ආධුනිකයින් සංඛ්‍යාවක් තවදුරටත් පුහුණුවේ රැඳී සිටියි.

වගුව 5: කර්මාන්තගත හා මධ්‍යස්ථානගත පුහුණු කිරීම් සාරාංශය

දිස්ත්‍රික්කය	ඉලක්ක	බඳවා ගැනීම්			පුහුණුව හැරයාම්			පුහුණුව සම්පූර්ණ කිරීම			පුහුණුවේ රැඳී සිටින සංඛ්‍යාව		
		පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව
කොළඹ	3,140	1,318	743	2,061	64	3	67	490	219	709	1,610	845	2,455
ගම්පහ	1,430	743	397	1,140	352	97	449	189	69	258	742	357	1,099
කළුතර	1,050	509	313	822	304	159	463	132	94	226	467	244	711
මහනුවර	1,370	552	533	1,085	47	112	159	259	148	407	579	458	1,037
මාතලේ	610	222	264	486	60	49	109	80	95	175	211	241	452
නුවරඑළිය	750	164	336	500	57	137	194	36	200	236	143	263	406
ගාල්ල	1,530	615	768	1,383	213	208	421	236	399	635	715	712	1,427
මාතර	1,360	509	776	1,285	253	229	482	252	301	553	478	651	1,129
හම්බන්තොට	1,270	366	574	940	121	141	262	201	274	475	284	476	760
යාපනය	1,010	287	502	789	57	98	155	183	286	469	350	464	814
මන්නාරම	580	231	247	478	4	1	5	209	167	376	263	228	491
වවුනියා	750	277	388	665	126	138	264	197	232	429	177	234	411
මුලතිව්	570	90	372	462	21	46	67	48	222	270	145	316	461
කිළිනොච්චි	620	263	265	528	121	66	187	139	142	281	217	212	429
මඩකළපුව	1,240	712	404	1,116	75	36	111	513	347	860	746	402	1,148
අම්පාර	1,060	605	308	913	89	41	130	416	184	600	684	294	978
ත්‍රිකුණාමලය	1,290	494	687	1,181	94	69	163	450	480	930	603	770	1,373
කුරුණෑගල	1,270	408	506	914	87	79	166	214	379	593	471	461	932
පුත්තලම	740	309	374	683	68	84	152	214	209	423	328	289	617
අනුරාධපුර	1,140	273	316	589	117	74	191	163	117	280	304	287	591
පොළොන්නරුව	920	143	476	619	117	272	389	240	275	515	102	104	206
බදුල්ල	880	207	391	598	131	154	285	53	177	230	177	293	470
මොණරාගල	650	175	240	415	83	66	149	53	98	151	155	187	342
රත්නපුර	1,100	452	554	1,006	193	103	296	222	244	466	488	513	1,001
කෑගල්ල	870	317	385	702	114	113	227	198	267	465	246	280	526
එකතුව	**27,200**	**10,241**	**11,119**	**21,360**	**2,968**	**2,575**	**5,543**	**5,387**	**5,625**	**11,012**	**10,685**	**9,581**	**20,266**

දිස්ත්‍රික් මට්ටමින් කර්මාන්තගත හා මධ්‍යස්ථානගත පුහුණු කිරීම් සාරාංශය මෙමඟින් නිරූපණය වේ. දිස්ත්‍රික්ක 25න් බඳවා ගත් මුළු ආධුනිකයින් සංඛ්‍යාව 21,360ක් වන අතර එය අපේක්ෂිත වූ ඉලක්කගත බඳවාගැනීමේ ප්‍රතිශතයක් ලෙස ගත් කළ ආසන්න වශයෙන් 79% හා අඟයක් ගත් කළ බඳවාගත් ආධුනිකයින් අතුරින් වැඩිම ආධුනික සංඛ්‍යාවක් බඳවා ගෙන ඇත්තේ කොළඹ දිස්ත්‍රික්කයෙනි. ඉලක්ක සපුරාලීම අතින් ගත් කල ඉදිරියෙන් සිටින්නේ මාතර දිස්ත්‍රික්කයයි. එහිදී 95%ක ඉලක්කයක් කරා ළඟා වීමට හැකි වී ඇත. පුහුණුව සම්පූර්ණ කළ මුළු ආධුනිකයින් ගණන 10,685ක් වන අතර, 20,266ක් තවදුරටත් දිස්ත්‍රික් මට්ටමින් පුහුණුව ලබමින් සිටී.

වගුව 6 : මධ්‍යස්ථාන පාදක පුහුණුව පූර්ණ කාලීන දිස්ත්‍රික් මට්ටමින් (ජාතික ආයතන හැර)

දිස්ත්‍රික්කය	බඳවා ගැනීම්			පුහුණුව හැරයාම්			පුහුණුව සම්පූර්ණ කිරීම්			පුහුණුවේ රැඳී සිටින සංඛ්‍යාව		
	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව
කොළඹ	50	102	152	-	3	3	38	46	84	50	102	152
ගම්පහ	11	27	38	2	4	6	10	25	35	11	27	38
කළුතර	49	55	104	10	12	22	38	43	81	61	53	114
මහනුවර	155	86	241	8	17	25	52	35	87	155	72	227
මාතලේ	12	69	81	3	14	17	7	55	62	12	63	75
නුවරඑළිය	21	156	177	5	54	59	7	152	159	18	141	159
ගාල්ල	29	129	158	6	13	19	24	104	128	36	124	160
මාතර	7	96	103	1	25	26	4	94	98	6	98	104
හම්බන්තොට	20	135	155	6	19	25	16	98	114	30	108	138
යාපනය	14	65	79	5	14	19	22	63	85	14	60	74
මන්නාරම	-	39	39	-	-	-	-	41	41	-	39	39
වවුනියා	34	47	81	11	4	15	10	30	40	23	43	66
මුලතිව්												
කිලිනොච්චි	72	120	192	51	32	83	20	94	114	64	99	163
මඩකළපුව	15	36	51	2	13	15	49	32	81	25	23	48
අම්පාර	-	34	34	-	5	5	-	25	25	-	14	14
ත්‍රිකුණාමලය	39	49	88	4	4	8	39	80	119	39	49	88
කුරුණෑගල	126	140	266	-	6	6	35	170	205	139	134	273
පුත්තලම	26	116	142	7	23	30	18	74	92	24	110	134
අනුරාධපුර	35	128	163	1	12	13	14	48	62	34	116	150
පොළොන්නරුව	9	43	52	9	6	15	41	45	86	9	38	47
බදුල්ල	22	64	86	10	18	28	19	72	91	21	80	101
මොණරාගල	25	89	114	11	32	43	5	19	24	21	68	89
රත්නපුර	19	152	171	-	-	-	21	138	159	19	149	168
කෑගල්ල	19	137	156	5	19	24	25	148	173	16	128	144
එකතුව	**809**	**2,114**	**2,923**	**157**	**349**	**506**	**514**	**1,731**	**2,245**	**827**	**1,938**	**2,765**

***පුහුණුව සම්පූර්ණ කිරීම් සහ පුහුණුව හැරයාම තුළ පෙර වර්ෂවල බඳවාගත් ආධුනිකයින්ද ඇත.

සමාලෝචිත වර්ෂය තුළ මධ්‍යස්ථාන පාදක ද්විත්ව පුහුණුවෙහි පූර්ණ කාලීන පාඨමාලා සඳහා ආධුනිකයින් බඳවා ගැනීමේ සාරාංශය ඉහත වගුව මඟින් නිරූපණය කෙරේ. දිස්ත්‍රික්ක මට්ටමින් මධ්‍යස්ථාන පාදක පුහුණුව සැලකීමේදී වැඩිම ආධුනිකයින් සංඛ්‍යාවක් බඳවා ගනිමින් කුරුණෑගල දිස්ත්‍රික්කය ඉදිරියෙන් සිටී. දිස්ත්‍රික්ක මට්ටමින් 2,245ක් වූ ආධුනිකයින් සංඛ්‍යාවක් පුහුණුව සාර්ථකව සම්පූර්ණ කර ඇති අතර 2,765ක් තවදුරටත් පුහුණුවේ යෙදී සිටියි.

වගුව 7 : කර්මාන්ත පාදක පුහුණුව පූර්ණ කාලීන දිස්ත්‍රික් මට්ටමින් (ජාතික ආයතන හැර)

දිස්ත්‍රික්කය	බඳවා ගැනීම්			පුහුණුව හැරයාම්			පුහුණුව සම්පූර්ණ කිරීම්			පුහුණුවේ රැඳී සිටින සංඛ්‍යාව		
	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව
කොළඹ	1,268	641	1,909	64	-	64	452	173	625	1,560	743	2,303
ගම්පහ	732	370	1,102	350	93	443	179	44	223	731	330	1,061
කළුතර	460	258	718	294	147	441	94	51	145	406	191	597
මහනුවර	397	447	844	39	95	134	207	113	320	424	386	810
මාතලේ	210	195	405	57	35	92	73	40	113	199	178	377
නුවරඑළිය	143	180	323	52	83	135	29	48	77	125	122	247
ගාල්ල	586	639	1,225	207	195	402	212	295	507	679	588	1,267
මාතර	502	680	1,182	252	204	456	248	207	455	472	553	1,025
හම්බන්තොට	346	439	785	115	122	237	185	176	361	254	368	622
යාපනය	273	437	710	52	84	136	161	223	384	336	404	740
මන්නාරම	231	208	439	4	1	5	209	126	335	263	189	452
වවුනියා	243	341	584	115	134	249	187	202	389	154	191	345
මුලතිව්	90	372	462	21	46	67	48	222	270	145	316	461
කිළිනොච්චි	191	145	336	70	34	104	119	48	167	153	113	266
මඩකළපුව	697	368	1,065	73	23	96	464	315	779	721	379	1,100
අම්පාර	605	274	879	89	36	125	416	159	575	684	280	964
ත්‍රිකුණාමලය	455	638	1,093	90	65	155	411	400	811	564	721	1,285
කුරුණෑගල	282	366	648	87	73	160	179	209	388	332	327	659
පුත්තලම	283	258	541	61	61	122	196	135	331	304	179	483
අනුරාධපුර	238	188	426	116	62	178	149	69	218	270	171	441
පොළොන්නරුව	134	433	567	108	266	374	199	230	429	93	66	159
බදුල්ල	185	327	512	121	136	257	34	105	139	156	213	369
මොණරාගල	150	151	301	72	34	106	48	79	127	134	119	253
රත්නපුර	433	402	835	193	103	296	201	106	307	469	364	833
කෑගල්ල	298	248	546	109	94	203	173	119	292	230	152	382
එකතුව	**9,432**	**9,005**	**18,437**	**2,811**	**2,226**	**5,037**	**4,873**	**3,894**	**8,767**	**9,858**	**7,643**	**17,501**

***පුහුණුව සම්පූර්ණ කිරීම් සහ පුහුණුව හැරයාම තුළ පෙර වර්ෂවල බඳවාගත් ආධුනිකයින්ද ඇත.


දිස්ත්‍රික් මට්ටමින් කර්මාන්ත පාදක පුහුණුවෙහි පූර්ණ කාලීන පාඨමාලාවන්හි දත්ත විශ්ලේෂණයන් වගුව මගින් නිරූපණය වේ. දිස්ත්‍රික්ක මට්ටමින් වැඩිම ආධුනිකයින් සංඛ්‍යාවක් බඳවා ගෙන ඇත්තේ කොළඹ දිස්ත්‍රික්කයයි. ආධුනිකයින් 18,437ක් දිස්ත්‍රික්ක මට්ටමින් බඳවා ගෙන ඇත. පුහුණුව සාර්ථකව අවසන් කළ ආධුනිකයින් සංඛ්‍යාව 8,767කි. දිස්ත්‍රික්ක මට්ටමින් පුහුණුවේ රැඳී සිටින සංඛ්‍යාව 17,501 කි.

වගුව 8 : අර්ධ කාලීන පාඨමාලා පුහුණුවීම් හි සාරාංශය

දිස්ත්‍රික්කය	බඳවා ගැනීම්			පුහුණුව හැරයාම්			පුහුණුව සම්පූර්ණ කිරීම්			පුහුණුවේ රැඳී සිටින සංඛ්‍යාව		
	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව
බදුල්ල	11	74	85	-	-	-	6	59	65	5	15	20
කළුතර	22	52	74	-	-	-	4	16	20	18	36	54
කෑගල්ල	-	-	-	-	-	-	6	36	42	-	-	-
මාතර	7	30	37	3		3	2	15	17	2	15	17
නුවරඑළිය	4	11	15	-	-	-	4	11	15	-	-	-
රත්නපුර	39	121	160	-	-	-	39	121	160	-	-	-
වවුනියා	5	15	20	-	-	-				5	15	20
එකතුව	**88**	**303**	**391**	**3**	**-**	**3**	**61**	**258**	**319**	**30**	**81**	**111**
කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය - කටුබැද්ද	158	3	161	-	-	-	158	3	161	-	-	-
මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය - ඔරුගොඩවත්ත	785	10	795	-	-	-	638	10	648	147	-	147
ඉංජිනේරු තාක්ෂණ ආයතනය - කටුනායක	3	24	27	1	-	1	-	-	-	2	24	26
මුළු එකතුව	**1,034**	**340**	**1,374**	**4**	**-**	**4**	**857**	**271**	**1,128**	**179**	**105**	**284**

දිස්ත්‍රික්ක මට්ටමින් හා ජාතික ආයතන තුළ පවතින අර්ධ කාලීන පාඨමාලා සඳහා අනුයුක්ත වූ ආධුනිකයින්ගේ පුහුණු වීම් හි සාරාංශය ඉහත වගුව මඟින් නිරූපණය වේ. දිස්ත්‍රික්ක 7ක් තුළ අර්ධ කාලීන පාඨමාලා පවත්වන අතර මෙම වසරේදී දිස්ත්‍රික්ක මට්ටමින් ආධුනිකයින් 391ක් බඳවා ගෙන ඇත. ජාතික ආයතන තුනෙන් බඳවා ගත් ප්‍රමාණය 1,374කි. දිස්ත්‍රික්ක මට්ටමින් පුහුණුව සම්පූර්ණ කළ ආධුනිකයින් ප්‍රමාණය 391 වන අතර ජාතික ආයතන තුළින් 1,128කි. දිස්ත්‍රික්ක මට්ටමින් පවත්වාගෙන යන අර්ධ කාලීන පාඨමාලාවන් සඳහා තවදුරටත් පුහුණුවේ රැඳී සිටින ආධුනිකයින් ගණන 111ක් වන අතර ජාතික ආයතන තුළින් පුහුණුවේ රැඳී සිටින සංඛ්‍යාව 284ක් වේ.


ප්‍රස්ථාරය 4 ඃ පැරටෝ විශ්ලේෂණය (මධ්‍යස්ථාන පාදක පුහුණු කිරීම)



මධ්‍යස්ථාන පාදක පුහුණුව තුළින් දිස්ත්‍රික්කයන් තුළ ආධුනිකයින්ගේ පාඨමාලා සඳහා ඇති ඉල්ලුම මෙම පැරටෝ විශ්ලේෂණ ප්‍රස්ථාරය මඟින් නිරූපණය වේ.

එහිදී පරිගණක චිත්‍ර ශිල්පී පාඨමාලාව සඳහා ඉහළ ඉල්ලුමක් ආධුනිකයින් තුළ පවතින බව හඳුනාගත හැක. තවද ප්‍රධාන වශයෙන් රූපලාවණ්‍ය ශිල්පී, හෙද සහායක, පුද්ගලික ලේකම් (ඉංග්‍රීසි) පාඨමාලා සඳහාද ආධුනිකයින් යොමු වීමේ වැඩි ප්‍රවනතාවයක් ඇතිව පවතී.


ප්‍රස්ථාරය 5 ඃ පැරටෝ විශ්ලේෂණය (කර්මාන්ත පාදක පුහුණු කිරීම)



සමාලෝචිත වර්ෂයෙහි දිස්ත්‍රික්ක මට්ටමින් පවතින කර්මාන්ත පාදක පුහුණු කිරීම් පාඨමාලාවන් සඳහා පවතින ඉල්ලුමෙහි විචලනයක් මෙම ප්‍රස්ථාරය මඟින් නිරූපණය වේ.

එහිදී පෙර පාසල් ගුරු පාඨමාලාව සඳහා වැඩි ඉල්ලුමක් පවතින අතර මෝටර් රථ යාන්ත්‍රික ශිල්පී, ඇඳුම් මසන්නා පාඨමාලාව සඳහා ද ආධුනිකයින් යොමු වීමේ නැඹුරුතාවය ඉහළ අගයක් ගනී.


ප්‍රස්ථාරය 6 ඃ පැරටෝ විශ්ලේෂණය (ජාතික ආයතන)



පැරටෝ විශ්ලේෂණය සහිත ඉහත ප්‍රස්ථාරය මඟින් ජාතික ආයතනයන්හි වැඩිම ඉල්ලුමක් පවතින පාඨමාලා පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමට හැකි වේ.


එහිදී මෝටර් රථ යාන්ත්‍රික ශිල්පී පාඨමාලාව සඳහා වැඩිම ඉල්ලුමක් නිරූපණය වේ.

ප්‍රස්ථාරය 7 ඃ රැකියාස්ථ පුහුණුව පෙර වර්ෂයන් සමඟ සැසඳීම



පෙර වර්ෂයන් තුළ රැකියාස්ථ පුහුණුවේ ආධුනික බඳවාගැනීමේ විචලනය ඉහත ප්‍රස්ථාරය මඟින් නිරූපණය වේ. 2021 වසරේ පෙර වසරවලට සාපේක්ෂව අවම බඳවාගැනීමක් සිදු වුවත් මෙම වසරේ 9,797ක් ආධුනික බඳවාගැනීමක් සිදු කරමින් නැවතත් වර්ධනයක් කරා ළඟා වීමට අප ආයතනයට හැකි වී ඇත.

ප්‍රස්ථාරය 8 ඃ යන්ත්‍රාගාර පුහුණුවේ ප්‍රගතිය පෙර වර්ෂයන් සමඟ සැසඳීම



යන්ත්‍රාගාර පුහුණුවෙහි ආධුනික බඳවා ගැනීමෙහි ප්‍රගතිය ප්‍රස්ථාරය මඟින් නිරූපණය කෙරේ.

වසර 7ක කාලසීමාවේදී ආධුනික බඳවා ගැනීමෙහි විචලනයන් පෙන්නුම් කරන අතර මුල් වසර කිහිපය තුළදී අඛණ්ඩ වර්ධන වේගයක් පෙන්නුම් කළත් 2020 හා 2021 වසරවලදී බඳවාගැනීම් හි අවමයන් නිරූපණය වීමට හේතු වශයෙන් කොරෝනා වසංගත උවදුර දැක්විය හැක. කෙසේ නමුත් 13,561ක් වූ ඉහළ ආධුනික බඳවා ගැනීමක් පෙර වසර කිහිපයකට සාපේක්ෂව සිදු කිරීම තුළින් සීඝ්‍ර වර්ධනයක් නිරූපණය කරයි.

වගුව 9 : විභාග, ඇගයීම් සහ සහතික පත් නිකුත් කිරීම

සහතික පත් වර්ගය		පරීක්ෂණ පැවැත්වූ සංඛ්‍යාව		අවසන් වෘත්තීය පරීක්ෂණයෙන් සමත්වූ සංඛ්‍යාව		ලබාදුන් සහතික පත් සංඛ්‍යාව	
		2021	2022	2021	2022	2021	2022
ජාතික වෘත්තීය සුදුසුකම	කර්මාන්ත පාදක	3,007	2,661	724	2,643	1,355	6,332
	මධ්‍යස්ථාන පාදක	695	2,534	653	2,532	1,537	2,128
	පෙර දැනුම පසු ඇගයීම	2,571	8,559	2,448	8,235	4,237	7,908
කර්මාන්ත ශිල්පී	මධ්‍යස්ථාන පාදක	24	139	14	113	1,460	-
	කර්මාන්ත පාදක	1,208	2,487	1,093	2,291		2,389
ස්ථානානුරූපී		270	865	261	836	270	805
ග්‍රාමීය මට්ටම		45	307	36	299	116	382
ඉංජිනේරු තාක්ෂණ ආයතනය		341	347	341	345	392	392
මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය		76	341	76	341	81	456
කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය		68	171		141		142
විශේෂ කර්මාන්ත පුහුණුව (NDT/HND)		5,213	8,812	5,213	8,812	2,625	502
රැකියාස්ථ පුහුණුව		-	-	-	-	2	-
වෙනත් (NCICT/NDICT/CELV/SLCCL/NTT/Other)		247	1,074	197	820	287	992
බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකාය				6,384	28,608		33,138
එකතුව		**13,765**	**28,297**	**17,440**	**56,016**	**12,362**	**55,566**

ඉහත වගුව මඟින් පරීක්ෂණ කටයුතු සිදු කිරීම, විභාග පැවැත්වීම සහ සහතික පත් නිකුත් කිරීම පිළිබඳව සංක්ෂිප්ත විශ්ලේෂණයක් නිරූපණය කෙරේ. එහිදී අවසන් වෘත්තීය පරීක්ෂණය සඳහා ආධුනිකයින් 28,297 ක් සහභාගි වී ඇති අතර ඒ අතුරින් 27,408ක් වූ ආධුනිකයින් වෘත්තීය පරීක්ෂණයෙන් සමත් වී ඇත. එය පෙර වසර හා සැසඳීමේදී 16% ක පමණ වූ වර්ධනයකි. 2022 වර්ෂය අවසානයේදී මුළු සහතික පත් 55,566ක් පුහුණුව සාර්ථක අවසන් කළ ආධුනිකයින් වෙත ලබා දීමට හැකි විය.

වගුව 10 : ජාතික නිපුණතා සම්මත සහ විෂයමාලා සංවර්ධන ප්‍රගතිය

ක්‍රියාකාරකම	**සංවර්ධිත සංඛ්‍යාව**	**වලංගු ගත කිරීම් සංඛ්‍යාව**	**සංශෝධිත සංඛ්‍යාව**
ජාතික නිපුණතා සම්මතයන් සහ විෂයමාලා	17	44	26
ඇගයීම් සම්පත්	2		
පුහුණු සම්මතයන්	1		
පරීක්ෂණ පත්‍ර	8		
ඉගෙනීමේ මාර්ගෝපදේශන පෙළ පොත්			
එකතුව	**28**	**44**	**26**

ජාතික නිපුණතා සම්මත සහ විෂයමාලාහි සංවර්ධනය, වලංගුගත කිරීම හා පුනරීක්ෂණ සිදු කිරීම් සංඛ්‍යාව පෙර වසර හා සැසඳීම මෙම වගුව මඟින් නිරූපණය කෙරේ. එහිදී සමාලෝචිත වර්ෂය තුළදී විවිධ වෘත්තීය පුහුණු ක්ෂේත්‍ර නියෝජනය කරමින් විෂය පාඨමාලා සඳහා ජාතික නිපුණතා සම්මත හා විෂය මාලා 28ක් සංවර්ධනය කර ඇත. ඒ අනුව නිපුණතා සම්මත වලංගු ගත කිරීම් 44ක් මෙම වසරේදී සිදු ඇති අතර පෙර වසර හා සැසඳීමේදී නිපුණතා සම්මත 12ක් වැඩිපුර සිදු කර ඇත.

2022 වර්ෂයේ විශේෂ වැඩසටහන් හා තොරතුරු

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය සහ Outreach Projects (Guarantee) Limited ආයතනය සමඟ එක්ව තරුණ තරුණියන් 250 දෙනෙකු සඳහා ආධුනිකත්ව පුහුණු ක්‍රමය යටතේ පුහුණුව ලබා දීම පිළිබඳ අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම ගරු අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය සුසිල් ප්‍රේම ජයන්ත මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සිදුවිය. මේ යටතේ ක්ෂේත්‍ර සහායක (කෘෂිකාර්මික), පෑස්සුම් ශිල්පී, වැඩිහිටි රැකවරණය, ඇළුමිනියම් පිරිසැකසුම් ශිල්පී, විදුලි කාර්මික ශිල්පී සහ හෝජනාගාර සේවක යන ක්ෂේත්‍ර යටතේ NVQ III මට්ටමේ සහතිකයක් ලබාදීමට සැලසුම් කර ඇති අතර පාඨමාලා කාලය මස 06 කි. පුහුණුව සාර්ථකව අවසන් කරන තරුණ තරුණියන් සඳහා Outreach Projects (Guarantee) Limited ආයතනය මඟින් කොළඹ, ගාල්ල, අනුරාධපුර, හම්බන්තොට සහ මඩකලපුව යන දිස්ත්‍රික්කවල රැකියා ලබාදීමට නියමිතය.

බියගම දිස්ත්‍රික් 306 B2 සිංහ සමාජය මඟින් ඉදිකරමින් පවතින නිපුණතා පුහුණු ආයතනය, ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය සමඟ එක්ව පුහුණු පාඨමාලා ආරම්භ කිරීම පිළිබඳ මූලික සාකච්ඡාවක් ප්‍රධාන කාර්යාලයේදී පැවැත්විණ. කලාපයට සරිලන නිපුණ ශිල්පීන් බිහිකිරීම මෙන්ම දැනට සේවයේ යෙදී සිටින කාර්ය මණ්ඩලය සඳහා නිපුණතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීමත් දෘශ්‍යාබාධිත ප්‍රජාව වෙනුවෙන් පුහුණු පාඨමාලාවන් පැවැත්වීමත් මෙම වැඩසටහනේ මූලික පරමාර්ථ විය.

නයිටා ආයතනය යටතේ ක්‍රියාත්මක කටුබැද්ද කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ කොරියානු භාෂා පාඨමාලාව ආරම්භ කරන ලදී. පළමු අදියර යටතේ කටුබැද්ද කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ සිසුන්ට මෙම පාඨමාලාව හැදෑරීමට අවස්ථාව ලැබෙන අතර බාහිර අයදුම්කරුවන් සඳහා ඉදිරියේදී පාඨමාලා සංවිධානය කිරීමට නියමිතය.

Glocal Fair 2022 කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ ප්‍රංගම සේවය ගාල්ල සමනල ක්‍රීඩාංගණයේ දී පවත්වන ලදී. රැකියාවක් සඳහා නිවැරදි මඟ කියන ආධුනිකත්ව පුහුණුව සඳහා ඇතුල්වීම, වෘත්තීය සුදුසුකම් පරීක්ෂා කර ගැනීම, NVQ සහතික ලබා ගැනීම, වෘත්තීය පුහුණු, ඇතුළු සේවාවන් මෙන්ම වෘත්තීය මාර්ගෝපදේශන සේවාවක්ද මෙහි ක්‍රියාත්මක විය.

අප රට තුළ ක්‍රියාත්මක වන සියළු රෝහල් අතුරෙන් හලාවත දිස්ත්‍රික් මහ රෝහල තුළ රෝහල් අධ්‍යක්ෂ වෛද්‍ය කපිල මල්ලවආරච්චි මහතාගේ සංකල්පයක් මත නියමු ව්‍යාපෘතියක් ලෙස රෝගීන් හට "ගුණාත්මක ආහාර වේලක් වඩාත් සුහදශීලි හා ගෞරවනීය ලෙස පිළිගැන්වීම" යන මැයෙන් ආරම්භ වූ වැඩසටහන මේ වන විට රෝහල තුළ ඉතා සාර්ථක අන්දමින් ක්‍රියාත්මක වෙමින් පවතී. එහිදී ආහාර සැකසීමේ අංශය, ආහාර රෝගීන් හට බෙදා දීමේ අංශය සහ මෙම සියළු කටයුතු අධීක්ෂණය කිරීමේ අංශය ලෙස මෙම අංශ තුනට අදාළ නිලධාරීන් පුහුණු කිරීමේ කර්තව්‍ය මාස 3 ක කාලයක් තුළදී සිදුකරන ලදී.

අතිගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් කොළඹ රාජකීය විද්‍යාලයේ දී දිස්ත්‍රික් 306-C-2 ලියෝ සමාජයේ "ලියෝ දිනය" පැවති අතර එහිදී ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය විසින් එම උත්සවයට සමගාමීව අධ්‍යාපනික තොරතුරු ඇතුළත් ප්‍රදර්ශන කුටියක් සංවිධානය කරන ලදී.

හොරණ නගර සභාව සහ ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය අතර පරිගණක චිත්‍ර නිර්මාණ ශිල්පී NVQ 4 වන මට්ටම ලබා දීමේ නව අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී. තවද ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු අධිකාරිය සහ Lanka Drone Pilots Association (LDPA) අතර ද අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී.

වත්මන් රජයේ ප්‍රතිපත්තියට අනුව දිළිඳු පවුල් ලක්ෂයකින් තෝරා ගත් ප්‍රතිලාභීන් ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය මඟින් NVQ 3 මට්ටමට අදාළව පුහුණු කර ඔවුන් රැකියාගත කිරීම ප්‍රධාන ව්‍යාපෘතියකි. මෙහි පළමු අදියර යටතේ අප අධිකාරිය මඟින් ප්‍රතිලාභීන් 34,000කට කර්මාන්තගත ආධුනිකත්ව පුහුණු ක්‍රමවේදය යටතේ මේ වනවිටත් පුහුණුව ලබාදී අවසන් කර ඇත.

මෙම ව්‍යාපෘතියේ දෙවන අදියර යටතේ තෝරා ගත් ප්‍රතිලාභීන් 4500කට "අලි විදුලි වැට නඩත්තු සහායක" පාඨමාලාව සම්බන්ධයෙන් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ NVQ 3 මට්ටමට අදාළව පුහුණුව ලබාදීමේ සමාරම්භක උත්සවය අම්පාර උහන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී පැවැත් විය.

දෙස් - විදෙස් හෙද සහ සෞඛ්‍ය කාර්යමණ්ඩලයේ රැකියා අවස්ථා වෙනුවෙන් NAITAහි අභිනවයෙන් ස්ථාපිත කෙරෙන හෙද සහ සෞඛ්‍ය සත්කාර හා හෙද පුහුණු අධ්‍යාපන ආයතනයේ (Institute of Nursing) Health Care Studies - (INHCS) පාලක මණ්ඩලය හා උපදේශක මණ්ඩලයට පත්වීම් ලිපි භාරදීම ගරු රාජ්‍ය අමාත්‍ය, විශේෂඥ වෛද්‍ය සීතා අරඹේපොල මැතිණියගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරිණි.

දැයට අවශ්‍ය පුහුණු බලකායක් නිර්මාණය කිරීමේ වැඩසටහනට සමගාමීව නයිටා ආයතනය, නිපුණත්වයෙන් පිරි, කාර්යක්ෂම තරුණ ශ්‍රම බලකායක් නිර්මාණය කිරීම උදෙසා පුද්ගලික අංශයේ දායකත්වය වෘත්තීය පුහුණුවට ලබා ගැනීමේ සුවිශේෂී ජාතික වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන ලදී.

මේ යටතේ හෝටල් ක්ෂේත්‍රයට අවශ්‍ය වෘත්තිකයින් බිහිකිරීමේ අරමුණින් ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය සහ Browns Hotels) Resorts පුද්ගලික සමාගම අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී. තවද මෙරට පුද්ගලික රෝහල් ක්ෂේත්‍රයට අවශ්‍ය නිපුණ ශිල්පීන් බිහිකිරීමේ අරමුණින් ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය සහ The Lanka Hospital Corporation PLC අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී.

කාර්යක්ෂම තරුණ ශ්‍රම බලකායක් නිර්මාණය කිරීම උදෙසා ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරියත් කීල්ස් සුපිරි වෙළඳ ජාලයත් එක්ව නිර්මාණය කළ Supermarket Model Basic Training Center ආරම්භ කරන ලදී. දෙස් විදෙස් රැකියා වෙළඳපොළ තුළ ඉහළ ඉල්ලුමක් ඇති "සුපිරි වෙළඳසැල් පාරිභෝගික සේවා සහායක" (Super Market customer service Assistant) යන තනතුර සඳහා අවශ්‍ය පුහුණුව ලබා දීම ද Supermarket මොඩියුලයක්, මූලික පුහුණු මධ්‍යස්ථානයක් හා ඇගයීම් මධ්‍යස්ථානයක් (Assessment Center) ලෙස ද මෙය භාවිතා කිරීමට අපේක්ෂිතය.

මෙරට 1971 සිට ක්‍රියාත්මක ආධුනිකත්ව පුහුණු ක්‍රමවේදය සහ දැනට ක්‍රියාත්මක NVQ ක්‍රමවේදය පිළිබඳව අධ්‍යනය කිරීමේ අරමුණෙන් නේපාලයේ රජයේ දූත පිරිසක් අප අධිකාරියවෙත පැමිණියහ. මෙම අවස්ථාව සනිටුහන් කරමින් දෙපාර්ශ්වය අතර සමරු සිහිවටන හුවමාරුවක්ද සිදුවිය. අධ්‍යාපන හා තාක්ෂණ රාජ්‍ය අමාත්‍ය විශේෂඥ වෛද්‍ය ගරු සීතා අරඹේපොළ මැතිණියගේ සංකල්පයකට අනුව අ.පොස (උසස් පෙළ) ඉංජිනේරු තාක්ෂණවේදය සහ පෙව පද්ධති තාක්ෂණවේදය හැදෑරූ සිසුන්ට ආධුනිකත්ව කර්මාන්තගත පුහුණුවකින් පසු ජාතික වෘත්තීය සුදුසුකම් 4 වන මට්ටමේ සහතික (NVQ 4) ලබාදීමේ වැඩසටහනක් අප ආරම්භ කරන ලදී.

ලක් රජය සහ ඕස්ට්‍රේලියානු රජය එක්ව ඕස්ට්‍රේලියානු රජයේ ආධාර යටතේ ක්‍රියාත්මක Skills for Inclusive Growth (S4IG) වැඩසටහන යටතේ අප අධිකාරිය, හෝටල් සහ ආගන්තුක සත්කාරක ක්ෂේත්‍රයේ පුහුණු අවස්ථා පුළුල් කිරීමට නව වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කිරීම උදෙසා අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී. එම ව්‍යාපෘතිය යටතේ සිදු කරනු ලබන එක් ප්‍රධාන වැඩසටහනක් වන

"Supreme Chef" රියැලිටි වැඩසටහනෙහි 03 වන අදියරෙහි සමාරම්භක උළෙල කැණිමඩල ශ්‍රවනාගාරයේදී පැවැත්විය. ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය (NAITA), ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරිය (VTASL) සහ ජාතික තරුණ සේවා සභාව (NYSC), ඩොන් බොස්කෝ ආයතනය, මියාමි ආයතනය, SLITHM යන ආයතන වල සූපවේදී පාඨමාලාව හදාරන තරුණ තරුණියන් මෙම තරඟාවලියේ තරඟකරුවන් ලෙස ඉදිරිපත් විය.

දිවයිනේ ප්‍රථම වරට ජාතික වෘත්තිය පරීක්ෂණ ක්‍රමවේදය තුළින් Hair Cutting Gents - Fashionable Hair dressing වෘත්තියේ නියුතු ශිල්පීන් සඳහා දෙස් විදෙස් පිළිගත් ජාතික වෘත්තිය පරීක්ෂණ සහතිකයත් (National Trade Test Certificate), Hair Dresser, Beautician සහ Bridal Dresser යන වෘත්තීන් වල නියුතු ශිල්පීන් සඳහා RPL ක්‍රමවේදය තුළින් ජාත්‍යන්තරව පිළිගත් ජාතික වෘත්තිය සුදුසුකම් සහතිකයත් (NVQ) පිරිනැමීමේ අරමුණින්, ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරියත් Dreamron College of Art & Beauty (Pvt) Limited ආයතනයත් අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් තැබිණි.

SSW වීසා කාණ්ඩය යටතේ ජපානයේ රැකියා ලබා ගැනීමට මෙරට තරුණ තරුණියන්ට පහසුකම් සැලසීමට අප අධිකාරිය මුලපුරා ඇත. අදාළ භාෂා නිපුණතා සහිත තරුණ තරුණියන්ට සහය වීම සඳහා පළමු අදියර ලෙස බස්නාහිර පළාතේ සිසුන් සඳහා මාර්ගගත පාඨමාලා ආරම්භ කරන ලදී. මෙම වැඩසටහන අප ප්‍රධාන කාර්යාලයේ කැණිමඩල චිත්‍රාගාරයෙන් වෙබ් විකාශනය වන මාර්ගගත වැඩසටහනක් ලෙස ක්‍රියාත්මක විය. එය අධීක්ෂණය කිරීම සඳහා JICA (ජපාන ජාත්‍යන්තර සංස්ථා නියෝජිතායතනය) හි නියෝජිත පිරිසක් පැමිණියහ.

අප අධිකාරිය සහ Archnix ආයතනය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී. මෙහි ප්‍රධාන පරමාර්ථය වූයේ තොරතුරු තාක්ෂණ අංශයේ NAITA ආධුනිකයින්ට පිළිවෙළින් වෙබ් සහ යෙදුම් භාෂා දැනුම වර්ධනය කරමින් එම අංශයේ වත්මන් යාවත්කාලීන දැනුම ලබා ගනිමින් ඉහළ මට්ටමේ රැකියා වෙළඳපොළට පිවිසීමේ දොරටුව විවෘත කිරීමයි.

2023 වර්ෂය සඳහා වැඩසටහන් හා ඉලක්ක

- 2023 වසර සඳහා ආධුනිකයින් 54,400 ක් බඳවාගැනීම සහ පුහුණු කිරීම.
- පුහුණුවන්නන් 10,000 ක් සඳහා රජයේ හා පෞද්ගලික අංශයේ කාර්යස්ථ පුහුණුව ලබා දීම.
- විශේෂ කර්මාන්ත පුහුණුව යටතේ උසස් පෙළ තාක්ෂණ විෂය ධාරාව හදාරන ආධුනිකයින් 5,000 ක් බඳවා ගැනීම හා පුහුණු කිරීම.
- 13 න් වසරක අධ්‍යාපන වැඩසටහන යටතේ ආධුනිකයින් 700 ක් බඳවාගැනීම
- ප්‍රවර්ධන සහ මාර්ගෝපදේශන වැඩසටහන් පැවැත්වීම.
- පාඩම් මාලා (මොඩියුල) බෙදා හැරීමට කටයුතු සම්පාදනය කිරීම.
- පාඨමාලා සාර්ථකව නිමකල සිසුන්ට දිස්ත්‍රික් මට්ටමින් සහතිකපත් ප්‍රදානෝත්සව 25ක් පැවැත්වීම.
- NVQ-RPL පෙර ඉගෙනුමෙන් පසු ඇගයීම යටතේ සහතිකපත්‍ර පිරිනැමීම.
- NVQ සහතිකලාභීන්ට දිස්ත්‍රික් මට්ටමින් ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- උපදේශකවරුන් පුහුණු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ජාතික ආයතන 3 හි සහතිකපත්‍ර ප්‍රදානෝත්සව 3 ක් පැවැත්වීම.

වගුව 11 : කාර්ය මණ්ඩල තොරතුරු

රැකියා තනතුර	අනුමත කළා සේවක සංඛ්‍යාව	2022/12/31 දිනට පවතින කාර්ය මණ්ඩලය
අධ්‍යක්ෂ ජනරාල්	1	1
අධ්‍යක්ෂක	5	3
නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ	18	15
අභ්‍යන්තර විගණක	1	1
අධ්‍යක්ෂ / විදුහල්පති	3	2
නියෝජ්‍ය විදුහල්පති	6	3
කථිකාචාර්ය	49	32
දිස්ත්‍රික් නිලධාරි	25	24
පුහුණු නිලධාරි	62	39
පරිපාලන නිලධාරියා	8	4
ලේකම් / නීති නිලධාරි	1	0
ගිණුම් නිලධාරියා	6	5
අභ්‍යන්තර විගණන නිලධාරි	1	0
වාහන අළුත්වැඩියා ඒකකයේ සේවා නිලධාරියා	1	0
තත්ත්ව සහතික කිරීමේ නිලධාරියා	4	4
ප්‍රසම්පාදන නිලධාරියා	1	1
පද්ධති පරිපාලක	1	1
දත්ත ගබඩා පරිපාලක	1	0
සංඛ්‍යාලේඛනඥ	1	1
පරීක්ෂක	462	378
උපදේශක	122	60
පුස්තකාලයාධිපති	3	1
පද්ධති විශ්ලේෂක	3	2
ප්‍රවාහන නිලධාරියා	1	0
තාක්ෂණ නිලධාරි	1	1
භාෂා පරිවර්තක	2	0
පොත් තබන්නා	4	2
ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂඥ	3	1
තාක්ෂණික චිත්‍ර ශිල්පී	3	0
සැළසුම් ශිල්පී	1	1
උපදේශක සහකාර	44	0
රසායනාගාර සහකාර	12	6
කළමනාකරණ සහකාර	260	248
පරිගණක චිත්‍ර ශිල්පී	2	2
නේවාසිකාගාර පාලක	2	1
රියදුරු සහ කාර්යාල සහායක	40	40
ලිතෝ යන්ත්‍ර ක්‍රියාකරු	4	3
මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු	2	0
පොත් බඳින්නා සහ කපන්නා	4	4
නිපුණ කාර්මික ශිල්පී	21	18
කාර්යාල කාර්ය සහායක	71	71
මුළු එකතුව	**1262**	**975**

සමාලෝචිත වර්ෂය තුළ ආයතනයේ කාර්ය මණ්ඩලය පිළිබඳ සංක්ෂිප්ත තොරතුරු වගුව මඟින් නිරූපණය කෙරේ.එහිදී අප අධිකාරිය මඟින් අනුමත කරන ලද සේවක සංඛ්‍යාව 1262කි. 2022 වර්ෂය අවසාන වන විට අනුමත සේවක සංඛ්‍යාවෙන් 77%ක් සම්පූර්ණ කරගනිමින් 975ක් වූ සේවක සංඛ්‍යාවක් අප ආයතනය තුළ සේවයෙහි නිරත වෙමින් පවතී.

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය
2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

වත්කම්	සටහන්	*2022 (රු.)*		*2021 (රු.)*	
ජංගම නොවන වත්කම්					
දේපල පිරියත හා උපකරණ	2	2,460,268,437.00		2,495,481,182.86	
කෙරීගෙන යන වැඩ	3	61,232,419.42	2,521,500,856.42	37,074,048.96	2,532,555,231.82
ජංගම වත්කම්					
තොගය	4	24,275,812.66		11,629,513.52	
ලැබිය යුතු දෑ	5	131,348,069.29		100,724,146.52	
තැන්පතු, පූර්ව ගෙවීම් සහ අත්තිකාරම්	6	48,520,999.64		53,838,156.05	
කෙටිකාලීන ආයෝජන	7	96,185,462.10		89,126,251.12	
මාර්ගස්ථ මුදල්	8	10,610.00		1,798,041.90	
මුදල් හා මුදල් සමාන දෑ	9	212,971,222.33	513,312,176.02	164,899,469.26	422,015,578.37
මුළු වත්කම්			**3,034,813,032.44**		**2,954,570,810.19**
කොටස් සහ වගකීම්					
සමුච්චිත අතිරික්තය/(හිඟය)	11	875,698,731.71		855,550,267.17	
සමුච්චිත අතිරික්තය අර්ධ කාලීන	11a	42,671,516.72		42,671,516.72	
සංචිත	11b	748,585,112.32		638,668,797.82	
රජයේ ප්‍රදාන-ප්‍රාග්ධන	11c	7,231,251.52		7,231,251.52	
රජයේ ප්‍රදාන -SSDP	11d	62,789,506.99		62,789,506.99	
විලම්බිත ආදායම	13	812,473,591.64	2,549,449,710.90	897,154,441.03	2,504,065,781.25
ජංගම නොවන වගකීම්					
පාරිතෝෂික ප්‍රතිපාදන	12	256,184,549.12	256,184,549.12	252,257,655.00	252,257,655.00
ජංගම වගකීම්					
ගෙවිය යුතු	10		229,178,772.42	198,247,373.94	198,247,373.94
මුළු කොටස් සහ වගකීම්			**3,034,813,032.44**		**2,954,570,810.19**

සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අන්තර්ගත කොටසක් වන අතර පිටු අංක 8 සිට 19 දක්වා හෙළිදරවු කර ඇත.

සහතික කිරීම

1971 අංක 38 දරන මූල්‍ය පනතේ අවශ්‍යතාවයට සහ ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව මූල්‍ය ප්‍රකාශය සකස් කර ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශනය පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම කළමනාකරණ මණ්ඩලය සතුය.

මෙම මූල්‍ය ප්‍රකාශන කළමනාකරණ මණ්ඩලයේ අනුමැතියට යටත් අතර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

W. M. A. K. Weerasekara
Director (Finance)
National Apprentice & Industrial Training Authority
971, Sri Jayawardenapura Mawatha, Welikada, Rajagiriya.

.....
ඩබ්. එම්. ඒ. කේ වීරසේකර
අධ්‍යක්ෂ (මූල්‍ය)

.....
ආචාර්ය කාංචනා සිල්වා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

W. Ruchika Amarasekara
Chairman
National Apprentice & Industrial Training Authority

.....
ඩබ්. ආර් අමරසේකර
සභාපති /ප්‍රධාන විධායක නිලධාරී

.....
ඩී. ආර්. සෝමවර්ධන
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

ජාතික ආධුනිකත්ව සහ පුහුණු කිරීම් අධිකාරිය
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
විස්තරාත්මක ආදායම් ප්‍රකාශය

විස්තරය	*සටහන්*	*2022 (රු.)*	*2021 (රු.)*
මෙහෙයුම් ආදායම			
රජයේ ප්‍රදාන - පුනරාවර්තන		1,188,500,000.00	1,093,500,000.00
රජයේ ප්‍රදාන - ප්‍රාග්ධන		67,950,000.00	-
ප්‍රාග්ධන ආධාර - හුවමාරු සහ හුවමාරු නොවන			
ලැබුණු ප්‍රාග්ධන ආධාර - හුවමාරුව		52,629,414.01	-
ලැබුණු ප්‍රාග්ධන ආධාර - හුවමාරු නොවන		12,755,731.58	-
රජයේ ප්‍රදාන - ප්‍රාග්ධන පුනරුත්තාපනය		-	8,990,978.79
ස්වයං උත්පාදක ආදායම්	11a	-	-
මාරුකල විලම්බිත ආදායම්	13	84,680,849.39	84,680,849.37
වෙනත් ආදායම්			
ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන		11,878,383.50	28,829,335.01
අනෙකුත් ආධාර	14	328,000.00	137,075.00
රැකියා ලක්ෂය වැඩසටහන් අරමුදල		15,183,000.82	88,823,618.04
අමාත්‍යාංශයේ ප්‍රදාන - නිපුණතා සිසු සවිය වැඩසටහන		39,447,600.00	15,819,000.00
SDVE ප්‍රදානය - අමාත්‍යාංශයේ කාර්ය සාධන දීමනාව		41,130,788.50	-
වෙනත් ආදායම්	15	148,583,986.67	78,309,067.10
මුළු ආදායම		**1,663,067,754.47**	**1,399,089,923.31**
මෙහෙයුම් වියදම්			
පුහුණු ද්‍රව්‍ය	16	14,901,561.15	14,367,681.27
වෙනත් පුහුණු වියදම්	17	249,011,364.03	184,330,473.80
කාර්ය මණ්ඩල වියදම්- පෞද්ගලික වේතන	18	835,468,760.28	739,442,023.76
කාර්ය මණ්ඩල වියදම්-වෙනත්	19	45,763,394.74	25,227,389.43
ප්‍රවාහන හා සන්නිවේදන	20	87,485,755.87	70,611,989.38
සැපයුම් සහ කාර්යාල අවශ්‍යතා	21	18,227,472.65	17,709,596.44
මුද්‍රණ ද්‍රව්‍ය සහ මුද්‍රණ පිරිවැය	22	1,613,529.86	-
උපකරණ නඩත්තුව	23	8,357,623.81	7,764,529.91
පරිශ්‍ර නඩත්තුව	24	161,659,549.36	157,983,472.86
මූල්‍ය හා වෙනත් වියදම්	25	3,281,023.11	6,312,258.21
ක්ෂයවීම්	26	229,293,332.66	231,946,085.35
විගණන ගාස්තු		1,288,650.00	1,171,500.00
සම්පූර්ණ මෙහෙයුම් වියදම්		**1,656,352,017.52**	**1,456,867,000.41**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වල ශුද්ධ අතිරික්තය (හිඟය)		**6,715,736.95**	**(57,777,077.10)**
අතිරික්ත/හිඟ පිළිබඳ සමුච්චිත ප්‍රකාශය			
නයිටා අරමුදල			
කලින් වාර්තා කරන ලද පරිදි ජනවාරි 1 වන දිනට		1,128,256,041.29	1,151,839,418.43
පෙර වර්ෂයේ ගැළපීම්		13,432,727.59	(23,583,377.14)
වසර අවසාන ශේෂය		1,141,688,768.88	1,128,256,041.29
පසුගිය වසරවල රඳවා ගත් ඉපැයීම්		(272,705,774.12)	(214,928,697.02)
අර්ධකාලීන			
කලින් වාර්තා කරන ලද පරිදි ජනවාරි 1 වන දිනට අර්ධ කාලීන		42,671,516.72	42,671,516.72
පෙර වර්ෂයේ ගැළපීම්		-	-
වර්ෂයේ ගැළපීම්		-	-
නැවත සඳහන් කර ඇති පරිදි ජනවාරි 1 වන දිනට		911,654,511.48	955,998,860.99
කාල සීමාව සඳහා ශුද්ධ අතිරික්තය/(හිඟය)		6,715,736.95	(57,777,077.10)
දෙසැම්බර් 31 වැනි දිනට ශුද්ධ අතිරික්තය/(හිඟය)		**918,370,248.43**	**898,221,783.89**

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා
ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය

විස්තරය	*සටහන්*	*2022 (රු.)*		*2021 (රු.)*	
මෙහෙයුම් ක්‍රියාකාරකම්					
කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය (හිඟය)			6,715,736.95		(57,777,077.10)
ගැලපීම්:					
ක්ෂයවීම		229,293,332.66		231,946,085.35	
විලම්බිත ආදායම්		(84,680,849.39)		(84,680,849.37)	
වත්කම් බැහැර කිරීමේ පාඩුව		-		2,125.06	
වත්කම් බැහැර කිරීමේ ලාභය		(13,683.53)		(3,148.79)	
බොල් ණය කාර්ය මණ්ඩල ණය		377,797.00		(68,671.00)	
විවිධ ණයකරුවන් සඳහා බොල් ණය		(345,970.21)		(20,785.09)	
ප්‍රාග්ධන ආධාර ලැබීම් - භුවමාරු නොවන		(12,755,731.58)		-	
ස්ථිර තැන්පතුවෙන් ලද පොළිය		-2,237,367.30		(8,990,978.79)	
උපචිත සඳහා නොඉක්මවූ ප්‍රතිපාදන		-		1,957,838.47	
උපචිත සඳහා ඉක්මවූ ප්‍රතිපාදන		-		(9,332,580.14)	
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන		19,240,212.00		13,133,719.50	
පාරිතෝෂික ගෙවීම්		(14,189,499.50)		(21,642,310.00)	
SLGTI වත්කම් භුවමාරු ලාභය				(16,297,465.69)	
භාණ්ඩ අලාභය				30,426.39	
තොග වැඩිවීම/අඩු වීම		(12,646,299.14)		2,970,786.93	
අය විය යුතු දේ අඩු/වැඩි වීම්		(30,623,922.77)		1,285,185.73	
තැන්පතු, කලින් ගෙවීම් සහ අත්තිකාරම්වල අඩු/වැඩි වීම්		(5,317,156.41)		(33,469,694.26)	
කෙටිකාලීන ආයෝජන අඩු /වැඩි වීම්		(11,035,939.90)		(8,243,558.95)	
ගෙවිය යුතු දේ අඩු/වැඩි වීම්		30,931,398.48		(28,080,543.57)	
			105,996,320.41		40,495,581.78
මෙහෙයුම් ක්‍රියාකාරකම් නිසා උත්පාදිත ශුද්ධ මුදල් ප්‍රවාහය			112,712,057.36		(17,281,495.32)
ආයෝජන ක්‍රියාකාරකම්					
පිරියත හා උපකරණ මිලදී ගැනීම		(32,746,962.11)		(47,734,963.35)	
වැඩ කෙරෙමින් පවතින ප්‍රාග්ධනයන්		(24,158,370.46)		(4,298,208.33)	
ස්ථාවර වත්කම් විකිණීම්වලින් ඉදිරියට				-	
විලම්බිත ආදායම් අතිරේකයන් ගැළපීම්			(56,905,332.57)		(52,033,171.68)
ආයෝජන ක්‍රියාකාරකම් නිසා උත්පාදිත ශුද්ධ මුදල් ප්‍රවාහය			(56,905,332.57)		(52,033,171.68)
මූල්‍ය ක්‍රියාකාරකම්					
රජයේ ප්‍රදාන ප්‍රාග්ධන		-		40,096,000.00	
SSDP ප්‍රාග්ධන		-		-	
ලද ආධාර		-		17,799,956.50	
ලද ස්ථාවර තැන්පතු පොලී		(13,499,132.54)		2,281,693.10	
			(13,499,132.54)		60,177,649.60
ආයෝජන කටයුතු නිසා උත්පාදිත ශුද්ධ මුදල් ප්‍රවාහය					60,177,649.60
මුදල් හා මුදල් වලට සමාන ශුද්ධ වැඩිවීම්/(අඩුවීම්)			42,307,592.25		(9,137,017.40)
කාලපරිච්ඡේදය ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දෑ			184,407,590.49		193,544,607.89
කාලපරිච්ඡේදය අවසානයේදී මුදල් හා මුදල් සමාන දෑ			**226,715,182.74**		**184,407,590.49**

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය
ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශය

විස්තරය	සමුච්චිත අරමුදල	රජයේ ප්‍රදාන ප්‍රාග්ධන	SSDP ප්‍රාග්ධන	විලම්බිත ආදායම් ප්‍රදාන (වගකීම්)	ආධාර ලැබීම්	අර්ධ කාලීන ගිණුම් මත ලාභය	යතුරුපැදි ආදායම් සංචිත	අර්ධ කාලීන ප්‍රාග්ධන සංචිත	අර්ධ කාලීන අනිවාර්යය සංචිත	AETI ඉඩම් හුවමාරු කිරීමේ ලාභය	නැවත තක්සේරු කිරීමේ සංචිතය	එකතුව
2022 ජනවාරි මස 01 දිනට ශේෂය	**1,128,256,041.29**	**7,231,251.53**	**62,789,506.99**	**897,154,441.03**	**153,886,950.46**	**42,671,516.72**	**7,415,059.28**	**11,148,914.78**	**5,902,130.56**	**290,860,815.72**	**169,454,926.85**	**2,776,771,555.21**
					-							-
එකතුකිරීම්: ආධාර ලැබීම්		-		-	-						**109,920,384.66**	**109,920,384.66**
ඉපැයීම් රඳවා ගැනීම	(272,705,774.12)											**(272,705,774.12)**
නැවත සඳහන් කර ඇති ආරම්භක ශේෂය	**855,550,267.17**	**7,231,251.53**	**62,789,506.99**	**897,154,441.03**	**153,886,950.46**	**42,671,516.72**	**7,415,059.28**	**11,148,914.78**	**5,902,130.56**	**290,860,815.72**	**279,375,311.51**	**2,613,986,165.75**
GOSL වසර සඳහා ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන		-										-
ප්‍රාග්ධන අළුත්වැඩියා		-										-
වසරේ ලාභය	6,715,736.95	-										**6,715,736.95**
වෂ්ය සඳහා ගැලපීම්	13,432,727.59			-	-						(4,070.00)	**13,428,657.59**
නැවත තක්සේරු කිරීමේ ලාභය											-	-
විලම්බිත වගකීමට මාරු කිරීම්		-		-	-							-
විලම්බිත ආදායමට මාරු කිරීම්				(84,680,849.39)								**(84,680,849.39)**
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	**875,698,731.71**	**7,231,251.53**	**62,789,506.99**	**812,473,591.64**	**153,886,950.46**	**42,671,516.72**	**7,415,059.28**	**11,148,914.78**	**5,902,130.56**	**290,860,815.72**	**279,371,241.51**	**2,549,449,710.90**

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය
ගිණුම්කරණ ප්‍රතිපත්ති

පොදු ගිණුම් ප්‍රතිපත්ති

1. වාර්තා කිරීමේ ආයතනය

1990 අංක 20 දරන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනත යටතේ ස්ථාපිත කොට ඇති ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය (මින් ඉදිරියට ආයතනය ලෙස සඳහන් කෙරේ) අංක 971, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය යන ලිපිනයෙහි පිහිටා ඇත.

2. සකස් කිරීමේ පදනම

ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිත සහ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම මත ආයතනයේ මූල්‍ය වාර්තා සකස් කර ඇත.

මූල්‍ය වාර්තා ඓතිහාසික පිරිවැය මත සකස් කෙරේ. මූල්‍ය වාර්තා ශ්‍රී ලංකා රුපියල් වලින් සටහන් කොට ඇත.

2.1 මූල්‍ය වර්ෂ 2022 තුළදී, ටැලි පද්ධති ශේෂයන් හා මූල්‍ය ප්‍රකාශන සඳහා වන ශේෂයන් සැසඳුම සඳහා ජාතික මධ්‍යස්ථානවල අර්ධකාලීන පාඨමාලා සම්බන්ධ ගනුදෙනු ටැලි පද්ධතියට ගෙන ඇත.

3. සංසන්දනාත්මක තොරතුරු

පසුගිය වර්ෂයට අදාළ අගයන් අදාල වසරේ ඉදිරිපත් කිරීම් සමඟ අදාළ වන පරිදි ගලපා ඇත.

4. රජයේ ප්‍රදාන සහ ආධාර

4.1 සංවිධානයේ වියදම් රජයේ ප්‍රදාන මත රඳා පවතින එම ප්‍රදාන ලැබීම් ලෙස ගිණුම්ගත කර ඇත. පුනරාවර්ථන වියදම් සඳහා අදාල රජයේ ප්‍රධාන විස්තරාත්මක ආදායම් ප්‍රකාශයට බැර කර ඇති අතර ප්‍රාග්ධන වියදම් සඳහා ලැබීම් ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අරමුදලට බැර කර ඇත.

4.2 වත්කම් මාරු කිරීම් ලෙස ලැබෙන රජයේ ප්‍රදානයන් විලම්භීත ආදායම් ලෙස සලකා ඒවායේ ආයුකාලය අනුව ගිණුම් ගත කර ඇත

5. වත්කම් සහ තක්සේරු කිරීම් පදනම

5.1 තොග

තොග සාමාන්‍යයෙන් පිරිවැය මත තක්සේරු කරනු ලැබේ. යල් පැන ගිය මුද්‍රිත ද්‍රව්‍ය තොග සඳහා 5%ක වෙන් කිරීමක් කර ඇත.

5.2 ලැබිය යුතු

අයවිය යුතු ප්‍රමාණයන් එපරිද්දෙන් දක්වා ඇති අතර 2022.12.31 දින වන විට අධිකාරියේ සේවය නොකරන සේවකයින්ගේ අඩමාන සහ බොල් ණය සඳහා 100% ප්‍රතිපාදන ලබා දී ඇත. අභ්‍යන්තර ගනුදෙනු වලින් අයවිය යුතු ණය හැර අනෙකුත් සියලුම ණයකරුවන් සඳහා 5% ප්‍රතිපාදන බොල් සහ අඩමාන ණය ලෙස ලබා දී ඇත.

5.3 දේපල, යන්ත්‍ර සහ උපකරණ

(I) දේපල, යන්ත්‍ර සහ උපකරණ සහ ආයෝජන දේපල පිළිගැනීම සහ මිනුම්

වත්කම් හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ගලා ඒමට සම්භාවිතාවක් ඇත්නම් ඒවා දේපල, පිරියත සහ උපකරණ ලෙස හඳුනාගෙන ඇති අතර වත්කම්වල පිරිවැය LKAS 16 - දේපල, පිරියත සහ උපකරණ වලට අනුකූලව විශ්වාසදායක ලෙස මැනිය හැක. මූලදී, දේපල, පිරියත සහ උපකරණ මිනිනු ලබන්නේ පිරිවැයෙනි.

(II) පිරිවැය ආකෘතිය

දේපල, පිරියත සහ උපකරණවල පිරිවැය එහි මිලදී ගැනීමේ මිල සහ වත්කම් එහි අපේක්ෂිත භාවිතය සඳහා ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒම සඳහා සෘජුවම ආරෝපණය කළ හැකි පිරිවැයකින් සමන්විත වේ. අධිකාරියේ කාර්ය සාධනය ගෙන යාම හෝ වැඩි කිරීම සඳහා ස්ථිර වත්කම් අත්පත් කර ගැනීම, දිගු කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා දරන ලද පසුකාලීන වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලැබේ.

(III) නැවත තක්සේරු කිරීමේ ආකෘතිය:

මූලික හඳුනාගැනීමෙන් පසු මැනීම සඳහා ඉහත සඳහන් කර ඇති හැර අනෙකුත් වත්කම්වල සම්පූර්ණ පන්තිය සඳහා ආයතනය නැවත තක්සේරු කිරීමේ ආකෘතිය යොදයි. ශ්‍රී ලංකා තක්සේරු දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලබන තක්සේරු කිරීම් මත පදනම්ව ඉඩම් සහ ගොඩනැගිලිවල සාධාරණ වටිනාකම තීරණය කරනු ලබන අතර අදාළ ලියකියවිලි නොමැතිකම සහ කාල සීමාවන් හේතුවෙන් සම්පූර්ණ වත්කම් පන්තිය සම්පූර්ණ කිරීමට නොහැකි විය.

ස්වාධීන තක්සේරුකරුවන් සහ NAITA හි වත්කම් නැවත තක්සේරු කිරීම සඳහා පත් කරන ලද කමිටුව, සමාන වත්කම්වල වර්තමාන වෙළඳපල මිල පවතින විට, එවැනි වත්කම්වල සාධාරණ වටිනාකම් තීරණය කිරීමේදී එවැනි සාක්ෂි සැලකිල්ලට ගනී. එවැනි දේපල නැවත තක්සේරු කරන ලද ප්‍රමාණයන්ගෙන් ගෙන යනු ලැබේ, පසුකාලීනව සමුච්චිත ක්ෂයවීම් සහ නැවත ඇගයීමේ දිනට පසුව අය කරන ලද සමුච්චිත අලාභ හානිවලට වඩා අඩුය. වත්කමක් නැවත තක්සේරු කරන විට, රැගෙන යන අගයේ යම් වැඩි වීමක් වෙනත් විස්තීරණ ආදායමකින් හඳුනාගෙන ප්‍රති ඇගයීම් සංචිතය යටතේ කොටස්වල එකතු වේ, එය ආදායම් ප්‍රකාශයේ කලින් හඳුනාගෙන ඇති එම වත්කමේ ප්‍රති තක්සේරු කිරීමේ අඩුවීමක් ප්‍රතිවර්තනය කරන ප්‍රමාණයට හැර, කලින් වියදම් කළ අඩුවීමේ ප්‍රමාණයට වැඩි වීම ආදායම් ප්‍රකාශයේ හඳුනාගෙන ඇත.

ප්‍රති තක්සේරුවේදී පැන නගින රැගෙන යන අගයේ අඩුවීමක් ආදායම් ප්‍රකාශයේ හඳුනාගෙන ඇති අතර, එම වත්කමේ පෙර අතිරික්තයක් හිලව් කරන ඕනෑම අඩුවීමක් වෙනත් විස්තීර්ණ ආදායමකින් හඳුනාගනු ලබන්නේ ඒ සම්බන්ධයෙන් ප්‍රති තක්සේරු කිරීමේ අතිරික්තයේ ඇති ඕනෑම ණය ශේෂයක ප්‍රමාණයකටය. වත්කම් ඕනෑම අතිරික්තයක් ආදායම් ප්‍රකාශයේ වියදමක් ලෙස පිළිගැනේ.

වත්කමක් සම්බන්ධයෙන් නැවත තක්සේරු කිරීමේ සංචිතයේ ඉතිරිව ඇති ඕනෑම ශේෂයක්, විශ්‍රාම යාමේදී හෝ වත්කම් බැහැර කිරීමේදී රඳවාගත් ඉපැයීම් වෙත සෘජුවම මාරු කරනු ලැබේ. ස්ථිර ස්වභාවයේ වත්කම් අත්පත් කර ගැනීම, දිගු කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා හෝ ආයතනයේ ඉපැයීමේ ධාරිතාව, කාර්යක්ෂමතාව හෝ ක්‍රියාකාරීත්වයේ කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා දරන ලද පසුකාලීන වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලැබේ. වත්කම් රැගෙන යන ප්‍රමාණයෙන් හඳුනාගෙන ඇත.

(IV) හඳුනා නොගැනීම

දේපල, කම්හල් සහ උපකරණ බැහැර කිරීමේදී හෝ මාරු කිරීමේදී හෝ ඒවා භාවිතයෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විට හඳුනා නොගනී. වත්කම් හඳුනා නොගැනීමෙන් ඇතිවන ඕනෑම ලාභයක් හෝ අලාභයක් (ශුද්ධ බැහැරකිරීමේ ආදායම සහ වත්කම් රැගෙන යන ප්‍රමාණය අතර වෙනස ලෙස ගණනය කෙරේ) වත්කම් වර්ෂයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ "අනෙකුත් මෙහෙයුම් ආදායම" තුළ හඳුනා නොගෙන ඇත.

(V) අස්පෘශ්‍ය වත්කම් - පරිගණක මෘදුකාංග හඳුනාගැනීමේ පදනම

වත්කමට ආරෝපණය කළ හැකි අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ගලා ඒමට සම්භාවිතාවක් ඇත්නම් අස්පෘශ්‍ය වත්කමක් හඳුනාගෙන ඇති අතර වත්කම්වල පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකිය.

සමාගම විසින් දරනු ලබන, භාවිත කිරීමට බලපත්‍ර ලබා දී ඇති, ඒ ආශ්‍රිත දෘඪාංගවලට අත්‍යවශ්‍ය නොවන, පැහැදිලිව හඳුනාගත හැකි, සමාගම විසින් දරනු ලබන, භාවිත කිරීමට බලපත්‍ර ලබා දී ඇති, ඒ ආශ්‍රිත දෘඪාංගවලට අත්‍යවශ්‍ය නොවන, පැහැදිලිව හඳුනාගත හැකි, විශ්වාසදායක ලෙස මැනිය හැකි සහ අනාගත ආර්ථික ප්‍රතිලාභවලට තුඩු දෙනු ඇතැයි සිතිය හැකි සියලුම පරිගණක මෘදුකාංග පිරිවැය

අස්පෘශ්‍ය වත්කම් කාණ්ඩය යටතේ මූල්‍ය තත්ත්වය සහ අඩුවෙන් සමුච්චිත ක්‍රමක්ෂකරණය සහ සමුච්චිත හානි පාඩු මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ඇතුළත් වේ.

(VI) කෙටි ආයු කාලයක් ඇති ඉන්වෙන්ට්‍රි

ප්‍රාග්ධනීකරණයට ද්‍රව්‍ය නොවන කෙටි ආයු ස්වභාවයක් ඇති ඉන්වෙන්ටරි අයිතම මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට කපා හරිනු ලැබේ. කෙසේ වෙතත්, පාලනය කිරීමේ අරමුණ සඳහා මෙම අයිතම ඉන්වෙන්ටරි කර ඇති අතර භෞතික පාලනය ක්‍රියාත්මක වේ.

(VII) ක්ෂය වීම්

ක්ෂයවීම ගණනය කරනු ලබන්නේ වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය මත සරල රේඛීය පදනමකිනි.

වත්කම් කාණ්ඩය	ක්ෂය වීම් අනුපාතය
බදු සමඟ පවතින ඉඩම්	කල් බදු කාලය තුළ
ගොඩනැගිලි	5%
පිරියත හා උපකරණ	10%
ගෘහ භාණ්ඩ , සවිකුරු හා කාර්යාල උපකරණ	10%
පරිගණක උපාංග	25%
මෝටර් රථ	25%
පුස්තකාල පොත්	10%
පුහුණු උපකරණ	10%
අස්පෘශ්‍ය වත්කම්	10%

6. මුදල් හා මුදල් සමාන දෑ

අතැති මුදල්, බැංකු තැන්පතු, කෙටි කාලීන ආයෝජන, මුදල් හා මුදල් සමාන ලෙස අර්ථ දැක්විය හැක.

අතැති මුදල් සහ බැංකු තැන්පතු, කෙටි කාලීන ආයෝජන, මාර්ගස්ථ මුදල්, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේදී මුදල් හා මුදල් සමාන ලෙස සැලකේ.

7. වගකීම් සහ ප්‍රතිපාදන

ශේෂ පත්‍රයේ දිනට ඇති සියලුම වගකීම් මුදල් ප්‍රකාශයට ඇතුළත් කර ඇති අතර දැනටමත් පවතිනවා යැයි සැලකෙන වගකීම් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන ලබා දී ඇති නමුත් ඒවායේ වටිනාකම නිවැරදිව ගණනය කළ නොහැක. ඉල්ලුම මත සිදුකළ යුතු ගෙවීම් හෝ ශේෂ පත්‍රයේ දින සිට වසරක් ඇතුළත සිදු කළ යුතු ගෙවීම්, මූල්‍ය ප්‍රකාශයේ වර්තමාන වගකීම් ලෙස සැලකේ. ශේෂ පත්‍රයේ දින සිට වසරකට පසුව සිදුකළ යුතු ගෙවීම් වත්මන්-නොවන වගකීම් ලෙස මුදල් ප්‍රකාශයේ සැලකේ.

.

8. පාරිතෝෂික ප්‍රතිපාදන

සියළුම සේවකයින්ට ආරම්භක වර්ෂයේ සිට ගෙවිය යුතු පාරිතෝෂික දීමනා සඳහා ප්‍රතිපාදන සලසා ඇත . කෙසේ වුවද, 1983 අංක 12 දරන ප්‍රතිපාදන පනතට සහ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 16 වන වගන්තියට අනුව සේවකයෙකු කෙරෙහි මෙම වගකීම බල පැවැත්වෙන්නේ වසර 5 ක අඛණ්ඩ සේවය සම්පූර්ණ කළ විටය.

9. නිශ්චිත දායක සැලසුම්

නිශ්චිත දායකත්ව සැලසුම් සඳහා ගෙවිය යුතු දායක මුදල්,වියදම් ලෙස ආදායම් ප්‍රකාශයේදී සැලකේ.
අධිකාරිය සේවක අර්ථසාධක අරමුදලට)EPF) සහ සේවක භාරකාර අරමුදල)ETF) සඳහා සේවකයින්ගේ දළ වැටුපෙන් 15% සහ 3% ට නොඅඩු මුදලකින් දායක වේ

10. ආදායම

රජයෙන් ලද ආධාර, පුනරාවර්තන වියදම් ලෙස ලද දේශීය හා විදේශීය ආධාර සහ අධිකාරියේ විවිධ ආදායම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට බැර කර ඇත. ප්‍රාග්ධන ප්‍රදානයන්ගෙන් ප්‍රධාන අලුත්වැඩියාවන් සහ ප්‍රාග්ධන වත්කම් වැඩිවීම් සඳහා වියදම් කළ මුදල් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට ප්‍රාග්ධනිත කර නොමැති අතර සමාන මුදලක් ප්‍රාග්ධන ප්‍රදානවලින් මාරු කර ඇත.

ස්ථාවර වත්කම්වල හඳුනාගත් වගකීම් සහ ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන ලැබීමෙන් පසු අතිරික්තය/හිඟය හෝ වියදමට වඩා වැඩි ආදායම ඇති විය.

අධිකාරිය ක්‍රියාත්මක කිරීමේදී සහ එහි ප්‍රාග්ධන වත්කම් පවත්වාගෙන යාමේදී සිදුවන වියදම් අයභාරගත කර ඇත.

11. ප්‍රාග්ධන කැපවීම් සහ අවිනිශ්චිත වගකීම්

සියළු ද්‍රව්‍යමය ප්‍රාග්ධන කැපවීම් සහ අවිනිශ්චිත වගකීම් සැලකිල්ලට ගෙන මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය වෙනස් කිරීම් හෝ අනාවරණය කිරීම් සිදු කරනු ලැබේ.

12. ශේෂ පත්‍රයේ දිනට පසු සිදුවීම්

ශේෂ පත්‍රයේ දිනට පසුව සිදු වූ සිදුවීම් සලකා බලා අවශ්‍ය අවස්ථාවන්හිදී ගිණුම් තුළ අවශ්‍ය වෙනස්කම් සිදු කර ඇත.

13. මුදල් ප්‍රවාහ ප්‍රකාශය

විලම්භිත ආදායම් අඩුවීම්/වැඩිවීම් මුදල් නොවන සංචලනයන් සේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා ඇත.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. VOT/D/NAITA/1/2022/34 ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2023 නොවැම්බර් 08 දින

සභාපති

ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණුකිරීම් අධිකාරිය

ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණුකිරීම් අධිකාරියේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණුකිරීම් අධිකාරියේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන හා විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ඕස්ට්‍රියානු ව්‍යාපෘති අරමුදලින් 2020 වර්ෂයේදී ලැබී තිබුණු රු.2,084,556,810 ක් වටිනා ගොඩනැගිලි, පුහුණු උපකරණ හා අස්පෘෂ්‍ය වත්කම් සමාලෝචිත වර්ෂය තුලදී ද ගිණුම්ගත කිරීමකින් තොරව හෙළිදරව් කිරීම පමණක් සිදු කර තිබුණි.

(ආ) 2017 වර්ෂයේදී පුහුණු කටයුතු සඳහා පරිත්‍යාගයක් ලෙස ලැබී තිබූ මෝටර් රථයේ ආනයනික වටිනාකම ගිණුම්ගත නොකිරීම හේතුවෙන් 2021 වර්ෂය තුලදී සිදුකල වත්කම් ප්‍රත්‍යාගණයේදී රු.1,256,152 ක් වූ එම වාහනයේ ශුද්ධ අගයෙන් ප්‍රත්‍යාගණන සංචිතය වැඩියෙන් හා ප්‍රාග්ධන ප්‍රදාන අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) අධිකාරිය සතු රු.5,280,000 ක්වූ ඉඩම් 03 ක වටිනාකම සහ මුලතිව් හා ගම්පහ පිහිටි පර්චස් 167.5 ක ඉඩම් කට්ටි 02 ක තක්සේරුකර ගිණුම් ගත කර නොතිබුණි.

(ඈ) 2020 දෙසැම්බර් 31 දින කල්බදු පදනම මත ලබාගත් රු.341,726,574 ක් වටිනා ඉඩම් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ක්‍රමක්ෂය නොකිරීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය හා සමුච්චිත අතිරික්තය රු.3,261,884ක් බැගින් ද ඉඩම් රු.6,523,768 කින් ද වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) 2021 වර්ෂයේදී පරිත්‍යාග ලෙස ලැබී තිබුණු ටැබ් යන්ත්‍ර 500 ක වටිනාකම තක්සේරු කර ගිණුම් ගතකර නොතිබුණි.

(ඊ) රැකියාලාභීන් 100,000 ක් පුහුණු කිරීමේ "Multi-Purpose Development Task Training Programme" සඳහා බහුකාර්ය සංවර්ධන කාර්යසාධක බලකා දෙපාර්තමේන්තුවෙන් 2022 වර්ෂය තුලදී ලැබිය යුතුව තිබුණු රු. 41,574,974 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේදී තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අධිකාරිය වෙත මුද්‍රණය කර ලබාදී තිබුණු සහතික පත් වෙනුවෙන් එම කොමිෂන් සභාව වෙත ගෙවියයුතු රු.20,638,200 ක් හා මුද්‍රණ කටයුතු වෙනුවෙන් පෞද්ගලික ආයතනයකට ගෙවිය යුතු රු.3,960,200 ක් ගිණුම් ගත කර නොතිබුණි.

(ඌ) 2017 සිට 2022 කාලපරිච්ඡේදය තුළ ඉදිකිරීම් වැඩ අවසන් කර තිබුණු කොන්ත්‍රාත් 06 ක රු.1,495,555 ක අත්තිකාරම් මුදල ප්‍රාග්ධනිත කර නොතිබීම හා එකතුව රු.20,103,595 ක් වූ අත්තිකාරම් පියවීම ගිණුම්ගත නොකිරීම හේතුවෙන් ජංගම වත්කම් රු.21,599,150 කින් වැඩියෙන් ද ගොඩනැගිලි වටිනාකම රු.1,495,555 කින් හා කෙරිගෙන යන වැඩ වටිනාකම රු.20,103,595 කින් අඩුවෙන් ද දක්වා තිබුණි.

(එ) මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයට අදාළ පාරිතෝෂික වෙන්කිරීම රු.31,813,587 ක් වුවද විගණනයේදී සිදු කරන ලද ගණනය කිරීම් අනුව එම අගය රු.22,300,913 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය හා 2022 දෙසැම්බර් 31 දිනට පාරිතෝෂික වෙන්කිරීම් ශේෂය රු.9,512,675 කින් පිළිවෙලින් අඩුවෙන් හා වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 අධිකාරියේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අධිකාරියේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනය සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, මාගේ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (I) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ (අ) ඡේදය යටතේ දක්වා ඇති නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම් තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනුයාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීතිරීති / විධානයට යොමුව	**නිරීක්ෂණ**
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 571 (2) මුදල් රෙගුලාසිය	2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි ඇතුලත් වසර 2කට වැඩි කාලයක් ගතව තිබූ එකතුව රු.30,404,624 ක් වූ ගෙවිය යුතු තැන්පතු ශේෂ නිරිවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.
(ආ)	2020 ඔක්තෝබර් 26 දිනැති අංක 02/2020 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය	බඳවාගැනීම් පරිපාටියට පටහැනිව අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා බඳවා ගැනීම හා වැටුප් හා දීමනා ගෙවීම සිදු කර තිබීම හේතුවෙන් 2020 ජනවාරි 04 දින බඳවාගෙන තිබූ අධ්‍යක්ෂ ජනරාල්වරයාට වැටුප් හා වෘත්තීය දීමනා ලෙස එකතුව රු.694,000ක් වැඩිපුර ගෙවා තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

(අ) 2015 සිට 2022 වර්ෂය දක්වා කාලය තුල මිලදී ගෙන තිබූ ලැප්ටොප් පරිගණක 111 ක් රාජකාරී අවශ්‍යතාවය හා තනතුරේ ස්වභාවය සලකා බැලීමෙන් තොරව නිලධාරීන් 103 දෙනෙකු වෙත ඔවුන්ගේ පෞද්ගලික නම්වලට බෙදාහැර තිබුණි. නිලධාරීන් 04 දෙනෙකුට පරිගණක 02 බැගින් හා නිලධාරීන් දෙදෙනෙකුට පරිගණක 03 බැගින් නිකුත් කර තිබුණු අවස්ථා විගණනයේ දී අනාවරණය විය.

(ආ) අධිකාරියේ මුද්‍රණ කටයුතු කිරීම සඳහා 11 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයක් හා රු.10,923,635ක් වටිනා යන්ත්‍රෝපකරණ සහිත වෙනම මුද්‍රණ අංශයක් ස්ථාපිත කර තිබුණද සමාලෝචිත වර්ෂයේදී මුද්‍රණ කටයුතු සඳහා රු.9,134,700 ක් බාහිර පාර්ශවයන් වෙත ගෙවා තිබුණි.

(ඇ) 2022 දෙසැම්බර් 31 දිනට වර්ෂ 1ත් වර්ෂ 5ත් අතර කාලපරිච්ඡේදයක සිට පැවත එන එකතුව රු.12,612,299 ක් වූ ණයගැති ශේෂ හා එකතුව රු.10,093,619 ක් වූ ණයහිමි ශේෂ ද, වර්ෂ 5 ට වැඩි එකතුව රු.31,396,431 ක ණයගැති හා එකතුව රු.3,348,035 ක ණයහිමි ශේෂ අයකර ගැනීමට හෝ නිරවුල් කිරීමට අපොහොසත් වී තිබුණි.

(ඈ) බහුකාර්ය සංවර්ධන කාර්යසාධක බලකා දෙපාර්තමේන්තුව සමඟ ඇතිකර ගත් ගිවිසුමකට අනුව 2020 වර්ෂයේ දී ආරම්භ කරන ලද රැකියාලාභීන් 100,000 ක් පුහුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2022 දෙසැම්බර් 31 දිනට රු.100,835,305 ක් වැයකර අපේක්ෂා කල රැකියාලාභීන්ගෙන් සියයට 35 ක් එනම් 34,660 දෙනෙක් පමණක් පුහුණුව නිමකර තිබුණි. මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් 2021 වර්ෂයේදී රු.4,650,800 ක් වැයකර තොරතුරු පද්ධතියක් ස්ථාපිත කර තිබුණ ද මෙමඟින් රැකියාලාභීන් රැකියාගත කිරීම පිළිබඳ තොරතුරු ලබා ගත නොහැකි වී තිබුණි.

(ඉ) පෙර දැනුම ඇගයීමේ ක්‍රියාවලියට (RPL) සහතිකපත් 5000 ක් බෙදාදීම සඳහා 2015 වර්ෂයේ දී මාතර දිස්ත්‍රික්කයේ පවත්වන ලද නිපුණතා අභිෂේක වැඩසටහනේදී සිදු වී තිබූ අක්‍රමිකතා සම්බන්ධයෙන් පවත්වන ලද විමර්ශනයට අදාල නිර්දේශ 2023 වර්ෂය වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඊ) කර්මාන්ත සහයෝගිතා ආධුනිකත්ව පුහුණු මධ්‍යස්ථානය යටතේ Higher Diploma in Digital Technician පාඨමාලාව සඳහා විද්‍යාගාරයක් ස්ථාපනය කිරීම වෙනුවෙන් 2021 නොවැම්බර් 19 දින චීන තානාපති කාර්යාලය මඟින් රු.10,099,202 ක් වටිනා අයිතම 84 ක පරිත්‍යාගයක් ලැබී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විටද අදාල ඩිප්ලෝමා පාඨමාලාව ආරම්භ කිරීමට සහ පරිගණක විද්‍යාගාරය ස්ථාපනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(උ) වෘත්තිය පුහුණුව ලබන සිසුන්ට ශිෂ්‍යාධාර ගෙවීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් ලබා දෙන ප්‍රතිපාදන සිසුන් වෙත ලබා දීමට විධිමත් වැඩ පිලිවෙලක් නොතිබීම හේතුවෙන් 2021 හා 2022 වර්ෂවලදී අධිකාරිය වෙත ලබාදී තිබුණු එකතුව රු.55,266,600 කින් රු.10,279,600 ක් සිසුන් වෙත ලබාදීමට කටයුතු නොකර ජංගම ගිණුමෙහි රඳවාගෙන තිබුණි.

(ඌ) ආංශික නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ප්‍රාග්ධන වියදම් දැරීම සඳහා 2017 සිට 2020 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී ලැබුණු මුදලින් රු.62,789,505 ක් අදාල අරමුණ වෙනුවෙනු වැය නොකර ගිණුමේ රඳවාගෙන තිබුණි.

(එ) ජාතික ආධුනිකත්ව හා පුහුණු කිරීමේ අධිකාරිය පිහිටුවීමේ අරමුණින් බැහැරව පුද්ගලයන් විදේශ රැකියා වලට යොමු කිරීමට 2022 වර්ෂයේදී ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් NAITA Foreign Employment (Private) Limited නමින් සමාගමක් පිහිටුවා බාහිර පුද්ගලයන්ගෙන් රු.මිලියන 1.2ක මුදලක් ලබාගෙන තිබුණද 2023 ඔක්තෝබර් 15 වන විටත් කිසිදු පුද්ගලයෙක් විදේශ රැකියා සඳහා යොමුකර නොතිබුණි. මෙම සමාගමේ ආදායම් හා වියදම්, පාලන ගිණුමක් මඟින් අධිකාරියේ ප්‍රධාන බැංකු ගිණුම හරහා සිදුකර තිබුණු අතර 2022 දෙසැම්බර් 31 දිනට මෙම පාලන ගිණුමේ ශේෂය රු.608,385 ක්ව තිබුණි. මෙම සමාගම පූර්ණ අක්‍රිය තත්වයේ පැවතුණද 2023 වර්ෂය සඳහා ද විදේශ රැකියා ඒජන්සියෙහි බලපත්‍රය අලුත් කිරීම සඳහා රු. 224,000ක් විදේශ සේවා නියුක්ති කාර්යාංශයට ගෙවා තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති